# අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

# වාර්ෂික වාර්තාව

# 2018

**සභාපති තුමාගේ පණිවුඩය**


| | |
|---|---|
| 1. හැඳින්වීම | 04 |
| 2. නෛතික සහ ප්‍රතිපත්ති මැදිහත්වීම් | 08 |
| දක්නට නොමැති බවට සහතිකය | 08 |
| බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියළු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත | 09 |
| වැළැක්වීම | 10 |
| ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත | 10 |
| පරීක්ෂණ පිළිබඳ නීති කෙටුම් පත | 12 |
| 3. විමර්ශන සහ පරීක්ෂණ | 14 |
| මන්නාරම සමූහ මිනීවළ | 15 |
| වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම | 16 |
| පැමිණිලි | 16 |
| අතුරුදහන් වූ සහ සොයාගත නොහැකි පුද්ගලයන් පිළිබඳව දැනට පවතින දත්ත සම්පිණ්ඩනය කිරීම | 17 |
| දත්ත බැංකුව | 17 |
| 4. ආයතනික සංවර්ධනය | 18 |
| භෞතික පරිශ්‍රයක් ස්ථාපනය කිරීම සහ කාර්ය මණ්ඩලය | 18 |
| ක්‍රියා පටිපාටි සහ නියමයන් සංවර්ධනය | 20 |
| මනෝ- - සමාජීය සහාය | 20 |
| ධාරිතා සංවර්ධනය සහ දැනුම බෙදා හදා ගැනීම | 21 |
| 5. ව්‍යාප්ති වැඩ සටහන් | 24 |
| ප්‍රසිද්ධ වැඩ කටයුතු | 24 |
| මාධ්‍ය සමග සම්බන්ධතාව | 24 |
| සන්නිවේදන ප්‍රචාරක ව්‍යාපාරය | 26 |
| සංඛ්‍යාත විද්‍යාමානතාව | 26 |
| 6. සැමරීම් සහ අනුස්මරණය කිරීම් | 26 |
| 7. මූල්‍ය කටයුතු | 28 |

# කෙටි යෙදුම්

| | |
|---|---|
| CoA | දක්නට නොමැති බවට සහතිකය |
| DMS | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව |
| HRC | මානව හිමිකම් කොමිසම |
| ICRC | අන්තර්ජාතික රතු කුරුස කමිටුව |
| MNIR | ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යාංශය |
| OMP | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය |
| PSU | මනෝ සමාජයීය සහාය ඒකකය |
| PTA | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත |
| SCRM | සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය |
| UNDP | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන |

**සභාපති තුමාගේ පණිවුඩය**

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ( පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම අතුරු දහන් වූවන් සහ සොයාගත නොහැකි පුද්ගලයන් පිළිබඳ සත්‍යය සොයා ගැනීම පිළිබඳ වූ ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයේ කඩඉමක් සනිටුහන් කරයි. රාජ්‍යය විසින් කලින් ස්ථාපනය කරන ලද යාන්ත්‍රණ මෙන් නොව අතුරුදහන් වූ තැනැත්තන් සඳහා වූ කාර්යාලය සිවිල් යුද්ධය, දේශපාලන නොසන්සුන්තාවය හෝ මහජන කැළඹීම් හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වූ හෝ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ ඉරණම තහවුරු කිරීමේ පැහැදිලි බල අධිකාරියක් ඇතිව පිහිටුවන ලද ස්ථිර, ස්වාධීන කොමිසන් සභාවකි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ වූ කාර්යාලයේ බල අධිකාරිය නිශ්චිත කාල සීමාවකට, ප්‍රදේශයකට හෝ ප්‍රජාවකට සීමා වන්නේ නැත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපනය කිරීම විවිධාකාර සන්දර්භයන් තුළ දශක හතරකට අධික කාලයක් තුළ පුළුල් වශයෙන් සිදු වූ අතුරුදහන්වීම් පිළිගැනීමක් මෙන්ම අපගේ රටේ දුකට පත් දහස් ගණන් වූ පුරවැසියන්ට පිළිතුරු සැපයීමට රජයේ වගකීම පැහැදිලිවම පිළිගැනීමක් ද වේ.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට කොමසාරිස්වරුන් පත් කිරීමෙන් පසු 2018 මාර්තු සිට 2018 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ මෙම කාර්යාලය ක්ෂේත්‍ර ගණනාවක විශේෂයෙන්ම, කාර්යාලය ක්‍රියාත්මක කිරීම සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල් සමග සම්බන්ධතා ඇති කර ගැනීම දක්වා ප්‍රගතියක් අත් කර ගෙන ඇත. ඊට අමතරව මෙම කාර්යාලය මූලික නෛතික සහ ප්‍රතිපත්ති මැදිහත්වීම් සහ පුද්ගල විමර්ශන සහ පරීක්ෂණ ගණනාවක් සිදු කරන ලදී.

මගේ සහෝදර කොමසාරිස්වරු සහ මා අප ඉදිරියේ ඇති කාර්ය භාරයේ විශාලත්වයත් විශ්වාසය රැඳවිය හැකි සහ ස්ථිර ආයතනයක් ගොඩ නැගීමේ අවශ්‍යතාවයත් පිළිගනිමු. මෙම කාර්යාලයට අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයන් තුළ පැවති සැකය සහ අවිශ්වාසය, එහි අධිකාරියට පිළිගැනීමක් නොමැතිවීම, ස්වාධීන කොමිෂන් සභාවක් වශයෙන් එහි තත්වය සහ ප්‍රධාන රාජ්‍ය ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම වැනි අභියෝග ගණනාවකට මුහුණ දීමට සිදු විය. මෙම කාර්යාලය ස්ථාපිත කිරීමෙන් පෙන්නුම් කරන ආකාරයට පුළුල් වශයෙන් ඇති අතුරුදහන්වීම් පිළිබඳව විධිමත් පිළිගැනීමක් පැවතුණත් එහි පද්ධතිගත ස්වභාවය ගැන සාමාන්‍ය ජනතාව සහ රාජ්‍ය ක්‍රියාකාරීන් දැනුවත් කිරීම සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වලට තවමත් ඇති කරවන විපත්දායී ප්‍රතිඵල ගැන සහානුකම්පාවක් ඇති කිරීමටත් තවදුරටත් විශාල වැඩ කොටසක් කව දුරටත් කළ යුතුව ඇත.

මෙම කාර්යාලයට වැඩ කිරීමේ හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහාත් නැවත සිදුවීම වැළැක්විම සඳහාත් පරීක්ෂණ පිළිබඳ නීති කෙටුම්පත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, දක්නට නොමැති බවට සහතික සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් නිරාකරණය සඳහා වූ පනත, යනාදිය සම්බන්ධයෙන් නෛතික සහ ප්‍රතිපත්ති ප්‍රතිශෝධන නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කරන ලදී. මෙම කාර්යාලයේ අතුරු වාර්තාවෙන් අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වලින් ඉතාමත් අවදානම් සහිත ඉතාමත් පීඩාකාරී ආර්ථික තත්වයක සිටින් තැනැත්තන් සැලකිල්ලට ගෙන 2019 අයවැයට ඇතුළත් කිරීම සඳහා සහන නිර්දේශ හයක් ඉදිරිපත් කෙරිණ.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට සංකේතාත්මක සිද්ධීන් ගණනාවකට අදාල තොරතුරු ලැබුණ අතර ඒවා සකස් කොට විශ්ලේෂණය කරන ලදී. 2018 ජූනි මාසයේ සිට මන්නාරම සමූහ මිනීවළ කැණීමේ කටයුතුවල නිරීක්ෂකයෙකු වශයෙන් සම්බන්ධ වී සිටින අතර මෙම ක්‍රියාවලිය පිළිබඳව මහජනතාවගේ විශ්වාසය තහවුරු කිරීම සඳහා අදාල යෝජනා ඉදිරිපත් කිරීමෙන් සහ මූල්‍ය ආධාර ලබා දීමෙන් සහාය විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නඩු පැවරීමේ බලයක් නැත. කෙසේ වුවත් අතුරුදහන් වූවන් සහ සොයා ගතනොහැකි පුද්ගලයන් ගේ අයිතිවාසිකම් ආමන්ත්‍රණය කිරීමේ දී යුක්තිය ඉටුවීම සහතික කිරීම කේන්ද්‍රීය වේ. එම අරමුණෙන් මෙම කාර්යාලය සිය අතුරු වාර්තාවෙන් පැහැර ගැනීම් සහ අදාල අපරාධ සම්බන්ධයෙන් එක් එක් සිද්ධීන් ගැන

කෙරෙන විමර්ශන සහ නඩු පැවරීම් බාධාවකින් තොරව ඉදිරියට යන බව තහවුරු කිරීමට නිර්දේශ ඉදිරිපත් කළ අතර ඒවා ගැන පසුවිපරම් කිරීම් ද සිදු කරමින් පවතී.

මෙම කාර්යාලය දක්නට නොමැති බවට සහතික නිකුත් කිරීම පහසු කිරීම සඳහා පවුල්වලින් ඉදිරිපත් කරන ලද එක් එක් සිද්ධීන් ගැන මැදිහත් වූ අතර අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන් ගේ පවුල්වලට සේවා සහ ප්‍රතිලාභ පහසුවෙන් ලබා ගැනීමට හැකි කරවනු වස් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් මෙම සහතික නිසි පරිදි පිළිගන්නා බව තහවුරු කිරීමට ද මැදිහත් විය. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ට අදාල පැමිණිලි ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යාංශයට ඉදිරිපත් කරන මෙන් ප්‍රසිද්ධ දැන්වීමක් නිකුත් කරන ලදී. ඒ අනුව ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යාංශයට ලැබුණු පැමිණිලි 14,641ක් මෙම කාර්යාලයට භාර දී ඇත. පැමිණිලි විභාග කිරීම සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ මධ්‍යගත ලේඛනයක් සකස් කිරීම සඳහා මෙම කාර්යාලය තාවකාලික දත්ත බැංකුවක් ස්ථාපනය කර ඇත. එය යොමු කිරීමේ සේවා සහ අනාගත විමර්ශන පහසු කරවනු ඇත.

අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන් අනුස්මරණය කිරීමේ පියවරක් වශයෙන් මෙම කාර්යාලය 2018 අගෝස්තු 30 වැනි දින පළමු වරට රජයේ අනුග්‍රහයෙන් අතුරුදහන් වූවන් පිළිබඳ අන්තර්ජාතික දිනය සමරණ ලදී.

ශ්‍රී ලංකාවේ සංහිඳියාව සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වලට සත්‍යය දැන ගැනීමට සහ යුක්තියට ඇති අයිතිය තහවුරු කළ යුතුයැයි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වාස කරයි. එම අරමුණෙන් පසුගිය මාස දහය තුළ මෙම කාර්යාලය එහි අධිකාරිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට පදනම දමූ අතර අදාල රාජ්‍ය ආයතන සහ සිවිල් සංවිධානවල පූර්ණ සහයෝගයෙන් තම කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමට ප්‍රයත්න දරනු ඇත.

ජනාධිපති නීතිඥ සාලිය පීරිස්,
සභාපති,
අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය.

1. හැඳින්වීම

1.1 2016 අංක 14 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ( පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත 2016 අගෝස්තු මස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. පනතේ ප්‍රතිපාදන අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත අතිගරු ජනාධිපති තුමන් විසින් එකී කාර්යාලය සඳහා පහත සඳහන් තැනැත්තන් සභාපති හා කොමසාරිස් වරුන් වශයෙන් පත් කරන ලදී.[1]

1. ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා සභාපති

2. ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය - කොමසාරිස්

3. නීතිඥ එස් කේ ලියනගේ මහතා – කොමසාරිස්

4. මේජර් ජනරාල් (විශ්‍රාමික) මොහන්ති පීරිස් මහත්මිය - කොමසාරිස්

5. ජයදීපා පුණ්‍යමූර්ති මහත්මිය- කොමසාරිස්

6. මිරාක් රහීම් මහතා - කොමසාරිස්

7 කනපතිපිල්ලෙයි වෙන්තන් මහතා - කොමසාරිස්

2018 පෙබරවාරි 28 දින පත් කරන ලද එකී සභාපතිගේ සහ කොමසාරිස්වරුන්ගේ ධූර කාලය වසර තුනකි.

1.2. මෙම කාර්යාලයට පුද්ගලයන් අතුරුදහන්වීමේ වාතාවරණයන් සහ ඔවුන්ගේ ඉරණම පැහැදිලි කිරීමට, එය නැවත සිදු නොවන බව සහතික කිරීම සඳහා අදාල බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමට, අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ වුවමනාවන් සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට, අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන් සඳහා සහන ලබා දීමේ මාර්ග හඳුනා ගැනීමට, අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන්ට අදාල දත්ත පවතින මූලාශ්‍රවලින් ලබා ගැනීමට සහ ලබා ගත හැකි සියලු තොරතුරු දත්ත බැංකුවක මධ්‍යගත කිරීමට පැහැදිලි අධිකාරියක් ලබා දී ඇත.[2]

1.3 රෙජිස්ට්‍රාර් ජනරාල්ට දක්නට නොමැති බවට සහතිකයක් නිකුත් කිරීමට හැකි වන පරිදි ඥාතීන්ට අවස්ථාව ලබා දීම සඳහා අතුරු වාර්තා නිකුත් කිරීම, අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ ඥාතීන්ට මනෝ සමාජීය ආධාර ඇතුළත්, පරිපාලන ආධාර සහ සුභ සාධන සේවා ලබා දීම හෝ එය පහසු කිරීම, අතුරුදහන් වූ හෝ සොයාගත නොහැකි තැනැත්තන්ට හෝ ඔවුන්ගේ ඥාතීන්ට හානිපූරණ ලබා දීම සඳහා අදාල බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම, වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට ක්‍රමයක් සකස් කිරීම සහ බලාත්මක කිරීම, අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන් සම්බන්ධ සියලු විස්තර ඇතුළත් වන දත්ත බැංකුවක් නිර්මාණය කිරීම, කළමනාකරණය සහ පවත්වා ගැනිම, අතුරුදහන් වූ සහ සොයාගත නොහැකි තැනැත්තන් ගේ පවුල්වල සාමාජිකයන් තුළ පවත්නා වේදනාව සහ ඔවුන්ට සිදුව ඇති හානිය පිළිබඳව ජනතාවගේ දැනුවත් භාවය සහ සංවේදිතාවය ඇති කරවීම සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට සාමාන්‍ය ජනතාව අතර සහාය පහසුකරණය

[1] 2016 අංක 14 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ( පිහිටුවීම, පරිපාලනය සහ තර්තව්‍ය ඉටු කිරීම) පනත 4,5,6 වගන්ති ( OMP Act )

[2] OMP Act 10 වගන්තිය

සහ ආර්ථික, මනෝ සමාජයීය, නෛතික සහ පරිපාලනමය සහාය ලබා ගැනීම තහවුරු කිරීම ඇතුළත් කාර්යයන් සහ වගකීම් රැසක් මෙම කාර්යාලයට පැවරී ඇත.[3]

1.4 අතුරුදහන් වූ තැනැත්තන් සඳහා වූ කාර්යාලයට නියමයන් සෑදීමට, ස්ත්‍රීපුරුෂ සමාජ භාවයට සංවේදී මාර්ගෝපදේශ වර්ධනය කිරීමට. කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ සේවයෙන් පහ කිරීමට හා කාර්යක්ෂමව ක්‍රියාත්මකවීමට අවශ්‍ය ඒකක ස්ථාපනය කිරීමට බලතල පැවරී ඇත.[4] වැඩි දුරටත් මෙම කාර්යාලයට අනාගතයේ අතුරුදහන්වීම් සිදුවීම වැළැක්වීම, අතුරුදහන් වූ තැනැත්තන් අනුස්මරණය කිරීමට සහ ඒ බව පිළිගැනීමට මාර්ග සහ ක්‍රම, හඳුනාගත නොහැකි සහ හඳුනාගත හැකි මළ සිරුරු සම්බන්ධයෙන් කටයුතු කිරීම, මහජනයා දැනුවත් කිරීම සඳහා අතුරුදහන් පුද්ගලයන්ට අදාල තොරතුරු ප්‍රකාශයට පත් කිරීම, අතුරුදහන් වූ තැනැත්තන්ට අදාල ජාතික නීති සහ රෙගුලාසි වර්ධනය කිරීම, අතුරුදහන් සහ සොයාගත නොහැකි තැනැත්තන් හා ඔවුන්ගේ ඥාතීන් ගේ සමාජ සහ ආර්ථික තත්වයන් වැඩි දියුණු කිරීම් සහ හානි පූරණ ලබා දීම මනෝ සමාජයීය සහාය ලබා දීම ඇතුළත් කරුණු ගණනාවකට අදාල නිර්දේශ අදාල බලධාරීන් වෙත ඉදිරිපත් කිරීමට  බලය ඇත.[5]

1.5 විමර්ශන කටයුතු පැවැත්වීම සඳහා පැමිණිලි ලබා ගැනිමට, අතුරුදහන් හෝ සොයාගත නොහැකි පුද්ගලයන් සිටින ස්ථානය දැන ගැනිමට පරීක්ෂණ සහ විමර්ශන ආරම්භ කිරීමට, අදාල තැනැත්තන් කැඳවීම ඇතුළත් සිද්ධීන් විමර්ශනය කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට, රහස්‍ය තොරතුරු හෝ රහසිගතව තොරතුරු ලබා ගැනීමට, රහස්‍ය භාවය රැක ගැනීමේ කොන්දේසිය යටතේ තොරතුරු ලබා ගැනීමට, මිනී වළවල් කැණීමට හෝ මළ සිරුරු ගොඩ ගැනීමට මහෙස්ත්‍රාත් අධිකරණයකින් නියෝගයක් ලබා ගැනීම සඳහා අයැදුම් කිරීමට සහ එවැනි කටයුතුවලට නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගිවීමට, රාජ්‍ය අංශයෙන් අවශ්‍ය සහායක් ඉල්ලා සිටීමට, පුද්ගලයන් රඳවා සිටින ස්ථාන වරෙන්තුවක් නොමැතිව  පරීක්ෂා කිරීමට සහ අනාවරණය වූ වැරදි අදාල නීති බලාත්මක කරන හෝ නඩු පැවරීමේ බලධාරීන්ට වාර්තා කිරීම ඇතුළත් සිද්ධීන් විමර්ශනය කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට මෙම කාර්යාලයට විශේෂිත බලතල ඇත.[6] කිසියම් පුද්ගලයෙකු අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය ඉදිරියේ පෙනී සිටිමට අපොහොසත්වීම හෝ මෙම කාර්යාලයෙන් නිකුත් කරන ලද සිතාසියකට අනුකූලව ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීම, මෙම කාර්යාලයෙන් ඔහුට හෝ ඇයට කරන ලද දැනුම් දීමක් හෝ ලිඛිත නියෝගයක දක්වා ඇති ආකාරයට හේතුවක් නැතිව ප්‍රශ්නවලට පිළිතුරු දීම හෝ පිළිපැදීම ප්‍රතික්ෂේප කිරීම, මෙම කාර්යාලයේ නිලධාරියෙකුට ඔවුන්ගේ බලතල ක්‍රියාත්මක කිරීමට විරෝධය දැක්වීම හෝ එය වැළැක්වීම හෝ මෙම කාර්යාලයේ කාර්යයන්ට දැනුවත්ව බාධා කිරීම ඇතුළත් හේතූන් ගණනාවක් සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධිකාරියට එරෙහිවීම අපහාස කිරීමේ වරදකට වැරදිකරුවෙකු විය හැකිය.[7]

1.6 මෙම කාර්යාලය අතුරුදහන් සහ සොයා ගත නොහැකි තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සහ වුවමනාවන් හි වැදගත්කම පිළිගැනෙන ආකාරයෙන් සිය අධිකාරී බලය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඊට අමතරව මෙම කාර්යාලය සිය කාර්යයන් සහ වගකීම් නීතියේ ආධිපත්‍යය තහවුරු වන ආකාරයට සහ පවතින නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම පහසුවන ආකාරයට සිදු කර ඇත.

[3] OMP Act 13 වගන්තිය

[4] OMP Act 11 වගන්තිය

[5] OMP Act 13 (1) (කේ) වගන්තිය

[6] OMP Act 12 වගන්තිය

[7] OMP Act 24 වගන්තිය

## 2. නෛතික සහ ප්‍රතිපත්ති මැදිහත්වීම්

2.1 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ට අදාලව නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ ඔවුන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පියවර ගැනීමට අධිකාරී බලයක් ඇත.[8] තවද මෙම කාර්යාලයට අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වලට ආර්ථික, මනෝ සමාජයීය, නීති සහ පරිපාලනමය ආධාර ලබා ගැනීම පහසුකරවීමේ කාර්යත් ද පැවරී ඇත.[9] මෙම කාර්යාලයට අනාගතයේ සිදු විය හැකි අතුරුදහන්වීම් වැළැක්වීමට, මළ සිරුරු සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සමාජ සහ ආර්ථික තත්වයන් වැඩි දියුණු කිරීම ඇතුළත් කරුණු ගණනාවක් පිළිබඳව වෙනත් රාජ්‍ය බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.[10] අතුරුදහන් වුවන් පිළිබඳ කාර්යාලයට තම කාර්යන් ඉටු කිරීම සඳහා නෛතික සහ ප්‍රතිපත්ති රාමුව තම අධිකාරි බලය ක්‍රියාත්මක කිරීමට හිතකර විය යුතුය.

2.2 මෙම කාර්යාලය දක්නට නොමැති බවට සහතික නිකුත් කිරීමට, පරීක්ෂණ පිළිබඳ නීති කෙටුම්පත, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ පනත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට අදාල මූලික නීති ප්‍රතිශෝධන නිර්දේශ සහ ප්‍රතිපත්ති මැදිහත්වීම් ගණනාවක් සිදු කර ඇත. මෙම මැදිහත්වීම් සිදු කරන ලද්දේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් නැවත සිදුවීම වැළැක්වීමට, අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වල අයිතිවාසිකම් සහ වුවමනාවන් ආරක්ෂා කිරීමට සහ මෙම කාර්යාලයේ අධිකාරි බලය පිළිගන්නා සහ ඊට උපනපූරණයවීම තහවුරු කිරීමේ අදහසිනි.

### දක්නට නොමැති බවට සහතිකය

2.3 ශ්‍රී ලංකා රජය විසින් අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වලට දක්නට නොමැති බවට සහතික නිකුත් කිරීමට හැකි කරවනු සඳහා 2016 අංක 16 දරන මරණ ලියා පදිංචි කිරීමේ (තාවකාලික විධි විධාන) (සංශෝධන) පනත සම්මත කරන ලදී. දක්නට නොමැති බවට සහතිකය අතුරුදහන් හෝ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ නෛතික තත්වය පැහැදිලි කෙරෙන ලේඛනයක් වන අතර අතුරුදහන් සහ සොයා ගත නොහැකි අයගේ පවුල්වලට පරිපාලන සහ මූල්‍ය සේවා සහ අනෙකුත් ප්‍රතිලාභ මරණ සහතිකය නොමැතිව ලබා ගැනීමට අවස්ථාව සලසයි. මෙම කාර්යාලයට අතුරුදහන් හෝ සොයාගත නොහැකි තැනැත්තන් සම්බන්ධයෙන් අතුරු වාර්තාවක් නිකුත් කිරීමට අධිකාරි බලයක් ඇති අතර ඉන් ඔවුන්ට රෙජිස්ත්‍රාත් ජනරාල් කාර්යාලයෙන් දක්නට නොමැති බවට සහතික ලබා ගැනිමට අවස්ථාව සලසයි.[11]

2.4 උතුරු හා නැගෙනහිර සිදු වූ ගැටුම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් හෝ සොයා ගත නොහැකි, දේශපාලන වියවුල්, මහජන කැළඹීම්, බලහත්කාරයෙන් හෝ සන්නද්ධ සේවාවල හෝ පොලීසියේ සාමාජිකයින් වශයෙන් සටනේ දී අතුරුදහන් වූ බව වාර්තා වූ පුද්ගලයන් සම්බන්ධයෙන් දක්නට නොමැති බවට සහතික නිකුත් කළ හැකිය.[12] මෙම කාර්යාලය දක්නට නොමැති බවට සහතිකයක් ලබා ගැනීමේ ක්‍රිය පරිපාටිය සහ එහි වලංගුතාවය පිළිබඳව

---

[8] OMP Act 2 (ආ), 10 වගන්තිය

[9] OMP Act 13 (ඉ, ඊ) වගන්තිය

[10] OMP Act 13 (1) (කේ) (I ) (iii), (vii) වගන්තිය

[11] OMP Act 13 (1) (අ) වගනිතිය
[12] 2016 අංක 16 දරන මරණ ලියා පදිංචි කිරීමේ (තාවකාලික ප්‍රතිපාදන) (සංශෝධන) පනත 8 අ වගන්තිය

අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල් සහ මහ ජනතාව තුළ දැනුවත් භාවයක් ඇති කිරීමේ උත්සාහයක නිරතව සිටී.

2.5 කෙසේ වෙතත් මෙම දක්නට නොමැති බවට සහතික ලබා ගෙන ඇති බොහෝ පවුල් පළාත් පාලන ආයතන, බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන සහ විදේශ දූත මණ්ඩල සමග කටයුතු කිරීමේ දී දක්නට නොමැති බවට සහතිකය ගැන දැනුවත් භාවයක් හෝ එහි වලංගු භාවය සහ අරමුණ ගැන පැහැදිලි අවබෝධයක් නොමැතිවීම නිසා එම ආයතන දක්නට නොමැති බවට සහතිකය පිළිගැනීම ප්‍රතික්ෂේප කරන අවස්ථා ඇති බවට වාර්තා වී ඇත. මෙම කාර්යාලය එවැනි තත්වයන්ට මුහුණ දුන් පවුල් සහ අදාල බලධාරීන් සමග සාකච්ඡා කොට අවශ්‍ය සංශෝධන හඳුනා ගෙන, දක්නට නොමැති බවට සහතිකයට අදාල පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් මැදිහත්වීම් සිදු කර ඇත.

2.6 මෙම කාර්යාලය දක්නට නොමැති බවට සහතිකය යොදා ගෙන බැංකු සේවා ලබා ගැනීමේ දී මතු වූ ගැටලු ගැන එම පවුල් කරන ලද පැමිණිලි විසඳීමට දේශීය බැංකු සමග මැදිහත්වීම් සිදු කරන ලදී. තවදුරටත් මෙම කාර්යාලය නොමැති බව පිළිබඳ සහතිකය පිළිගැනීමේ දී තම නියාමන බැඳීම් සමග ඇති විය හැකි ගැටුම් ගැන මූල්‍ය ආයතන මතු කළ කරුණු විසඳීම සඳහා මහ බැංකුවේ අධිපති සමග සාකච්ඡාවකට ආරම්භ කරන ලදී.

2.7 අතුරුදහන් සහ සොයා ගත නොහැකි පවුල් මරණ සහතිකයක් නොමැතිව වීසා අයදුම් කිරීමේ දී මුහුණ දෙන දුෂ්කරතා ගැන මෙම කාර්යාලයට කරුණු සැළ කර ඇත. ඊට ප්‍රතිචාර වශයෙන් මෙම කාර්යාලය විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්ට සහ ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති සියලු දූත මණ්ඩලවලට අතුරුදහන් හෝ සොයාගත නොහැකි දෙමාපියෙකු හෝ ළමයෙකු සම්බන්ධයෙන් නිකුත් කර ඇති දක්නට නොමැති බවට සහතිකයේ අරමුණ සහ වලංගු භාවය පැහැදිලි කරමින් ලිඛිතව කරුණු දැනුම් දෙන ලදී.

2.8 තවදුරටත් අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්, දක්නට නොමැති බවට සහතිකයක් ලබා ගැනිමට දිස්ත්‍රික් රෙජිස්ත්‍රාත් ඉල්ලා සිටින ලිපි ලේඛන ලබා දී ඔවුන් මුහුණ දෙන දුෂ්කරතා මෙම කාර්යාලයට ඉස්මතු කර දක් වූහ. මෙම කාර්යාලය රාජ්‍ය සහ පළාත් පාලන ආයතන නිලධාරීන් අතර දැනුවත් භාවයක් ඇති කිරීම සඳහා සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය සමග සාකච්ඡා ආරම්භ කරන ලදී.

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ පනත**

2.9 2017 දෙසැම්බර් 10, ශ්‍රී ලංකාව, සියලු පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීම සඳහා වූ අන්තර්ජාතික සම්මුතියට අත්සන් තබන ලදී. මෙම සම්මුතිය යටතේ ඇති බැඳීම් 2018 අංක 5 දරන සියලු පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීම සඳහා වූ අන්තර්ජාතික සම්මුතිය ( බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ පනත) ක්‍රියාත්මක කිරීම තුළින් දේශීය නීතියට සංයුක්ත කරන ලදී.

2.10 අතුරු වාර්තාවෙන් දක්වන ලද ආකාරයට බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම අපරාධයක් බවට පත් කිරීම, මුක්තියට එරෙහි සටනේ සතුටුදායක ජයග්‍රහණයකි. කෙසේ වුවත් දේශීය නීතියෙන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම අපරාධයක් ලෙස නම් කිරීම ප්‍රමාණවත් නොවන්නේ යැයි මෙම කාර්යාලයේ අතුරු වාර්ථාවෙන් සිය කණස්සල්ල පළ කරන ලදී. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් නිර්වචනය කිරීමේ දී අපරාධයේ සමහර කොටස් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ පනත ක්‍රියාත්මක කිරීමට පෙරාතුව සිදු වූ අවස්ථා පැහැදිලිවම ඇතුළත් කිරීමට අපොහොසත්විමෙන් අපරාධය දිගටම සිදුවන ස්වභාවය පිළිගැනීමට අපොහොසත් වේ. මෙම පනතින්, සම්බන්ධ විය හැකි අපරාධකරුවන් මෙන්ම බලහත්කාර අතුරුදහන් කිරීම පිළිබඳ අණදීම පිළිබඳ වගකීමේ සම්පූර්ණ විෂය පථයේ පුළුල් පරාසයම ඇතුළත් කර ගෙන නැත. එමෙන් ම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම මානව

වර්ගයාට එරෙහි අපරාධයක් ලෙස පිළිගෙන නැත. අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ට අදාල පැමිණිලි විමර්ශනය කිරීමට මෙම කාර්යාලයේ අධිකාරි බලයට අමතරව මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රමාණවත්ව පිළිගෙන නැත.

2.11 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඉහත සඳහන් කරුණු පිළිබඳව සංශෝධන පනවන ලෙස අතිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැති තුමාට සහ අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමති ඇතුළුව අදාල රාජ්‍ය බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කෙළේය.

## වැළැක්වීම

2.12 මෙම කාර්යාලය බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වැළැක්වීමට ක්‍රියාත්මක කළ යුතු නීතිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ පිළිබඳව නිරීක්ෂණ ගණනාවක්ම ඉදිරිපත් කර ඇත. නිදහස අහිමි කිරීම බලහත්කාර අතුරුදහන් කිරීම්වල කේන්ද්‍රීය ලක්ෂණයකි. නිදහස අහිමි කිරීමට අදාලව ප්‍රබල නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම නැවත සිදුවීම වැළැක්වීමේ අතිශයෙන් වැදගත් ආරක්ෂක පියවරකි. අපගේ අතුරු වාර්තාවෙන් සිදුවෙමින් ඇති අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම් පිළිබඳ වාර්තා, රැඳවියන්ට හිරිහැර කිරීම් මෙන්ම වධහිංසා සහ අත් අඩංගුවේ දී සිදුවන මරණ ගැන සඳහන් කර ඇත.

2.13 රඳවා ගෙන සිටින පුද්ගලයන් ගර්හාවට ලක් කෙළේයැයි කියන සිද්ධීන් විමර්ශනය කිරීමට සහ අත් අඩංගුවට ගැනීමේ දී සහ රඳවා ගැනීමේ දී විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීම තහවුරු කිරීමටත් මෙම කාර්යාලය පොලිස්පතිවරයාට නිර්දේශ ඉදිරිපත් කර ඇත. සියලුම පුද්ගලයන් රඳවා ගැනීමේ මධ්‍යස්ථාන මෙන්ම රැඳවියන්ගේ සම්පූර්ණ ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කිරීම සහ බලය ලත් ස්ථානවල හැර වෙනත් ස්ථානවල කිසිම පුද්ගලයෙකු රඳවා නොගත යුතු බව පොලිස්පතිවරයාට තවදුරටත් නිර්දේශ කරන ලදී.

2.14 එමෙන් ම, මෙම කාර්යාලය හමුදාව රඳවා ගෙන ඇති පුද්ගලයන් ඇතුළුව රඳවා ගෙන සිටින පුද්ගලයන් ගර්හාවට ලක් කර ඇතැයි කියන චෝදනා විමර්ශනය කිරීමට තම පූර්ණ සහයෝගය ලබා දෙන මෙන් ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ අණදෙන නිලධාරීන්ට නියෝග නිකුත් කරන මෙන් ආරක්ෂක ලේකම්වරයාට නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඊට අමතරව මෙම කාර්යාලය, තම අත් අඩංගුවේ පසුවන සියලු රැඳවියන්ට විධිමත් ක්‍රියා පටිපාටිය අනුව ක්‍රියා කරන බවත්, රඳවා ගැනීම පිළිබඳ වාර්තා දැඩි ලෙස නීතියට අනුකූලව සිදු කරන බවත් ආරක්ෂක අංශ විසින් තහවුරු කළ යුතුයැයි නිර්දේශ ඉදිරිපත් කෙළේය.

## ත්‍රස්ත විරෝධී පනත

2.15 2018 ඔක්තෝබර් මස ආණ්ඩුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කොට ඒ වෙනුවට ත්‍රස්ත විරෝධී පනත යනුවෙන් හැඳින්වෙන පනතක් පාර්ලිමේන්තුවේ සභා ගත කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීම සහ යෝජිත පනතට අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීමෙන් ආරක්ෂා කිරීම සඳහා පියවර ගණනාවක් ඇතුළත් කිරීම මෙම කාර්යාලය අගය කරයි.

2.16 පසුගිය පරීක්ෂණ කොමිෂන්වල නිගමන සහ නිර්දේශ සහ ශ්‍රී ලංකාව වාර්තාවී ඇති අතුරුදහන්වීම් වලින් ලොව දෙවන විශාල අතුරුදහන් වීමේ අනුපාතයක් පවතින රටක තත්වයට පත්වීම සැලකිල්ලට ගෙන යෝජිත ත්‍රස්ත විරෝධී පනතෙන් ජාතික ආරක්ෂාව සහ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අතර තුලනයක් පවත්වා ගැනීම සහතික කිරීම ඉස්මතු කරයි.

2.17 බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම වැළැක්වීම සහ අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන් පිළිබඳ සිද්ධීන් ඇතිවීම වැළැක්වීම සඳහා සියලුම අවස්ථාවන්හි රැඳවියන් ලේඛන ගත කර තිබීම සහ කිසිම ආයතනයකට හෝ ක්‍රියාකාරිකයෙකුට ඔවුන් කෙරේ සීමාවක් රහිත බලයක් නැති බව සහතික කිරීමට ප්‍රබල සංවරණ සහ තුලන ක්‍රමයක් ක්‍රියාත්මකව පැවතීමත් අතිශයෙන් වැදගත් බව මෙම කාර්යාලය අවධාරණය කරයි. රැඳවියන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිත භාවය තහවුරු කිරීම සඳහා අත් අඩංගුවට ගැනීමේ බලතල සීමා කිරීම, රැඳවුම් නියෝග අධිකරණ සුපරීක්ෂාවට යටත් කිරීම, නීති නියෝජිතයන්ට සහ/හෝ පවුලේ සාමාජිකයන්ට ඔවුන් හමුවීමට අවස්ථා සහතික කිරීම සහ රහසිගතව රඳවා ගැනීමේ ඉඩකඩ බැහැර කිරීම අතිශයෙන් වැදගත් ය.

2.18 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතිගරු ජනාධිපති තුමා සහ ගරු අගමැති තුමා හමුව සැලකිල්ලට ගත යුතු කරුණු ගණනාවක් ඉදිරිපත් කළ අතර ත්‍රස්ත විරෝධී පනතේ පහත සඳහන් පරිදි වේ.

(අ) ඉහළ ශ්‍රේණියක පොලිස් නිලධාරීන්ට සහ යුද හමුදාවේ, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ සහ වෙරළාරක්ෂක බලකායේ සමාන ශ්‍රේණියක නිලධාරීන්ට පමණක් වරෙන්තුවක් නැතිව අත් අඩංගුවට ගැනිමට ඉඩ දීම[13]

(ආ) රැඳවීමේ නියෝග ලබා දීමේ අධිකාරිය නියෝජ්‍ය පොලිස්පත්වරුන්ට ලබා නොදිය යුතුය. එවැනි බලතල නියෝජය පොලිස්පති වරයෙකුගේ අයැදුම් පතක් හරහා අධිකරණ බලධාරීන් වෙත තිබිය යුතු අතර කුමන තත්වයක් යටතේ හෝ එය අධිකරණ බලධාරීන්ගේ පුනරීක්ෂණයට ලක් කිරීමට හැකි විය යුතුය.[14]

(ඇ) අතිගරු ජනාධිපති තුමා 2016 ( මානව හිමිකම් කොමිසමේ නිර්දේශ මත පදනම්ව ) අත් අඩංගුවට ගැනීම සහ රඳවා ගැනිම පිළිබඳව කරන ලද නියෝගවලට ඇතුළත්ව ඇති අදාල ආරක්ෂක විධි විධාන ත්‍රස්ත විරෝධි පනතට ඇතුළත් කළ යුතුය.[15]

(ඈ) භාරව සිටින නිලධාරියෙකුට ලබා දී ඇති අභිමතානුසාරී බලය ඉවත් කර සැකරුවෙකුට වහාම තම පවුලේ අය සහ නීති නියෝජිතයෙකු හමුවීමේ අවස්ථාව තහවුරු වන ආකාරයට 48(1) වගන්තිය සංශෝධනය කිරීම[16]

(ඉ) අනුමත කළ, පුද්ගලයන් රඳවා ගැනීමේ ස්ථාන අවම වශයෙන් ඒවා භාවිතා කිරිමට මාසයකට පෙර ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතු වන ආකාරයට 31(6) වගන්තිය සංශෝධනය කළ යුතුය. එමෙන් ම දැනටමත් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශට පත් කර ඇති පුද්ගලයන් රඳවා ගැනීමේ ස්ථානය තව දුරටත් පවත්වා ගෙන නොයාමට තිරණය කෙළේ නම් එම තිරණය දින දාහතරක් ඇතුළත ප්‍රකාශයට පත් කළ යුතුය.[17]

(ඊ) අත් අඩංගුවට ගැනීම දැනුම් දිමට අපොහොසත්වීම මෙන්ම රඳවා ගැනීම් පිළිබඳ නිවැරදි සහ කාලීන වාර්තා තබා ගැනීමට අපොහොසත්වීම අපරාධවරුන් බවට පත් කෙරෙන ප්‍රතිපාදන ඇතුළත් කිරීම[18]

[13] බලන්න, ත්‍රස්ත විරෝධී පනත 17 වගන්තිය

[14] බලන්න, ත්‍රස්ත විරෝධී පනත 31(1),41 වගන්තිය

[15] 1979 අංක 48 ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන පනත යටතේ අතිගරු මෛත්‍රිපාල සිරිසේන මහතා විසින් අත් අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම පිළිබඳව නිකුත් කළ නියෝග බලන්න. (2016)

[16] බලන්න, ත්‍රස්ත විරෝධී පනත 48(1),44 වගන්ති

[17] බලන්න, ත්‍රස්ත විරෝධී පනත 31(6) වගන්ති

[18] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාව,(2018) ඡේදය 47 (ඊ) බටහිර, දකුණ සහ සබරගමුව පළාත්වල කැමැත්තෙන් තොරව ඉවත් කිරීම හෝ අතුරුදහන් පුද්ගලයන් පිළිබඳව පරික්ෂා කිරීමට පත් කළ පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසාන වාර්තාව, සැසි වාර්තා අංක V (1977) 114 -115 කැමැත්තෙන් තොරව අතුරුදහන් කළ සමහර

(උ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ බලතල සහ කාර්යයන්[19] අනුව මෙම කාර්යාලය හෝ මානව හිමිකම් කොමිෂන් සභාව ඉල්ලා සිටින අවස්ථාවක පොලිස්පති එම තොරතුරු ලබා යුතු බවට 26(3) වගන්තිය සංශෝධනය කිරීමට සහ මෙම කාර්යාලයේ හෝ මානව හිමිකම් කොමිෂන් සභාවේ බලය ලත් නිලධාරියෙකුට අනුමත රැඳවුම් ස්ථානයක් බැලීමට යෑමට අවසර ලැබෙන ආකාරයට 34 වගන්ති සංශෝධනය කිරීම[20]

(ඌ) ත්‍රස්ත විරෝධී පනත, විසම්මුතිය විශේෂයෙන්ම මානව හිමිකම් ආරක්ෂකයින් සහ එම පවුල් මර්ධනය කිරීමට යොදා නොගන්නා බව සහතික කිරීමට සහ ත්‍රස්තවාදියයි ගැනෙන ක්‍රියා විෂය සීමාව පුනරීක්ෂණය කිරීමට සහ මූලික අයිතිවාසිකම් භාවිතයට යොදා ගැනෙන සියලු නිත්‍යානුකූල ක්‍රියා ත්‍රස්තවාදි ක්‍රියායැයි නොගැනීම තහවුරු කරන ආකාරයට පනතේ අනන්‍ය වගන්ති ශක්තිමත් කිරීම[21]

(එ) කාලාවරෝධී නියෝග, සීමා කිරීමේ නියෝග, ඇඳිරි නීතිය පැනවීමේ නියෝග, කිසියම් ප්‍රසිද්ධ හෝ පුද්ගලික ස්ථානයක් තහනම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරිමේ නියෝග සහ අවශ්‍යතාවය සහ ප්‍රමාණානුකූලතාවයේ මූලධර්මවලින් සන්නද්ධ හමුදා කැඳවීම ප්‍රකාශයට පත් කිරීමේ අධිකාරිය සීමා කිරීම[22]. එවැනි නියෝග එකක් හෝ වැඩි ගණනක් බලපැවැත්වීම මෙම කාර්යාලයට සහ මානව හිමිකම් කොමිෂන් සභාවට හෝ මහෙස්ත්‍රාත්වරයෙකුට රැඳවියන් රඳවා ගැනීමේ ස්ථානයකට පිවිසීම සීමා නොකෙරෙන බව සහතික කිරීම.

**පරීක්ෂණ පිළිබඳ නීති කෙටුම් පත**

2.19 2018 සැප්තැම්බර් මස මෙම කාර්යාලය අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය විසින් ආරම්භ කරන ලද නිති, පටිපාටි සහ මරණ පරීක්ෂණ පැවැත්විමට අදාල භාවිතා සංශෝධනය කිරීම පිළිබඳ කමිටුවට යෝජනා ඉදිරිපත් කෙළේය. මළ සිරුරු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇති නීතියේ හිඩැස් පිරවීමට සහ මළ සිරුර සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහායවීම ඇතුලත් විමර්ශන පැවැත්වීමට මෙම කාර්යලයට ඇති අධිකාරි බලය පුළුල් කිරීම සඳහා මරණ පරීක්ෂණ පිළිබඳ නීතිය සංශෝධනය කළ යුතුය.

2.20 මරණ පරීක්ෂණ පිළිබඳ නීති පැනවීම කඩිනම් කිරීමත්, පවතින නීති සහ භාවිතාවේ ඇති බරපතළ හිඩැස් පියවන මූලපත්‍ර සහ මෙහෙයුම් ක්‍රියා පටිපාටි ප්‍රමිතීන් ස්ථාපනය කිරීමේ වැදගත්කම මෙම කාර්යාලය අවධාරණය කර ඇත. මරණය අනුමාන කිරීම සඳහා සාක්ෂිමය කරුණු ඉදිරිපත් කිරීමේ වගකීම අඩු කිරීමට, එම සිද්ධිය අවශ්‍යනම් මහාධිකරණයට යොමු කිරීමේ විකල්පය සමග ස්වාභාවික හෝ මිනිසා විසින් ඇති කරන ලද ආපදාවන්ගෙන් සිදු වූ සමූහ අනතුරු ගැන පරීක්ෂණ කිරීමේ අධිකරණ බලය මහෙස්ත්‍රාත් අධිකරණයට රඳවා ගැනීමට, හඳුනා නොගත් මළ සිරුරු හඳුනා ගැනීමට මෙම කාර්යාලයේ සහාය ඉල්ලා සිටීමට මහෙස්ත්‍රාත් අධිකරණයට අවස්ථාව ලබා දීමට, සහ භූමදාන කිරීමට පෙර ජෛව විද්‍යාත්මක සාම්පල සංරක්ෂණය කිරීම සඳහා සාධාරණ පියවර ගැනීමට මෙම කාර්යාලය නිර්දේශ ඉදිරිපත් කර ඇත.

පුද්ගලයන් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසාන වාර්තාව (සමස්ත දිවයින) සැසි වාර්තා අංක 1 (2001) 24 – 25 බලන්න.

[19] බලන්න, අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 12 (ඉ) (ඊ) (උ) වගන්තිය

[20] බලන්න, ත්‍රස්ත විරෝධී පනත 26(3), 34 වගන්ති

[21] බලන්න, ත්‍රස්ත විරෝධී පනත 3,4, 5. 6,(ආ) (ඈ) 8, 10 වගන්ති

[22] ත්‍රස්ත විරෝධී පනත 81(1), 82(1) 83(1) 84(1) 85(1) වගන්ති බලන්න.

**අතුරු වාර්තාව**

2.21 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය අතුරු වාර්තාවෙන් තම ආදරණීයන් නැතිවීමෙන් ඉතාමත් අසරණ තත්වයට පත් අතුරුදහන් සහ සොයාගත නොහැකි පවුල්වල සාමාජිකයන්ට අතුරු සහන ලබා දීමට නිර්දේශ කර ඇත. එවැනි අතුරු සහන පියවර තමන් මුහුණ දුන් හානියෙන් එම පවුල්වලට හදිසි සහනයක් ලබා දීම අදහස් කරන ඒවා ලෙස සැලකිය යුතු අතර එය හානිපූරණයෙන් වෙනස් කොට සැලකිය යුත්තේය. මෙම කාර්යාලය 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වූ කාර්යාල පනත සම්මත කිරීම සම්බන්ධව ප්‍රසාදය පළ කරන අතර තමන්ට සිදුව ඇති හානියට ප්‍රතිකර්ම වශයෙන් අතුරුදහන් සහ සොයාගත නොහැකි වූවන්ගේ පවුල්වලට පූර්ණ හානිපූරණයක් ලබා දීමට ඇති බැඳීම නැවත අවධාරණය කරයි.

2.22 මෙම කාර්යාලය සිය අතුරු වාර්තාවෙන් පහත සඳහන් අතුරු සහන පියවර 2019 අයවැය වාර්තාවට ඇතුළත් කිරීමට නිර්දේශ කෙළේය:

අ) මූල්‍ය ආධාර වැඩ සටහන: ස්ථිර ආදායමක් නොමැති ජීවත්ව සිටින කලත්‍රයාට, ළමයාට/ළමයින්ට සහ/හෝ අතුරුදහන් හෝ සොයාගත නොහැකි පුද්ගලයෙකුගේ ජීවත්ව සිටින දෙමාපියනට මාසිකව රු. 6000.00 ක ජීවන දීමනාවක් ලබා දීමේ මූල්‍ය ආධාර වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම. මෙය අතුරු පියවරක් වශයෙන් ක්‍රියාත්මක කළ යුතු අතර අවසාන හානිපූරණ ලබා දීමෙන් පසුව නතර විය යුතුය.

ආ) ණය සහන වැඩ සටහන: අතුරුදහන් සහ සොයාගත නොහැකි වූවන්ගේ පවුල් (අ) මුදල් අමාත්‍යාංශය විසින් තිරණය කරන වටිනාකම හෝ ඊට අඩු ප්‍රමාණයක ණය ( නිදසුන් වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ණය වැනි) කපා හැරීම අරමුණු කර ගත් ණය සහන වැඩ සටහන්වල හෝ (ආ) ආර්ථික ස්ථාවරත්වය සහ ආත්ම විශ්වාසය සාක්ෂාත් කිරීම අරමුණු කර ගත් මුදල් අමාත්‍යාංශයේ ''එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා'' වැනි මූල්‍ය ආධාර වැඩ සටහන් සහ ණය යෝජනා ක්‍රමවල වෙනස් ප්‍රමුඛතා කාණ්ඩයක් ලෙස ඇතුළත් කිරීම

(ඇ) නිවාස සංවර්ධන වැඩ සටහන: අතුරුදහන් සහ සොයා ගත නොහැකි තැනැත්තන්ගේ පවුල් නිවාස අමාත්‍යාංශයේ දැනට පවතින වැඩ සටහන් තුළ වෙනස් ප්‍රමුඛතා කාණ්ඩයක් ලෙස ඇතුළත් කිරීම පහසුකරණය: ස්ථිර නිවාස ඉදි කිරීම සඳහා නව නිවාස වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හෝ අර්ධ වශයෙන් ඉදි කළ නිවාස සම්පූර්ණ කිරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීම

(ඈ) අධ්‍යාපන ආධාර වැඩ සටහන: අතුරුදහන් සහ සොයා ගත නොහැකි තැනැත්තන්ගේ දරුවන්ගේ ප්‍රාථමික සහ ද්වීතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට අවශ්‍ය කෙරෙන වියදම් ආවරණය කරනු සඳහා මසකට රු. 2000/ක දීමනාවක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දීම.

(ඉ) වෘත්තීය පුහුණු සහ ජීවන මාර්ග සංවර්ධන වැඩ සටහන්: තාක්ෂණ පුහුණුව සහ රැකියාවේ නිරතව සිටියදී පුහුණු කිරීමේ ප්‍රතිපාදන සහිතව පුද්ගල සංවර්ධන පාඨමාලා හඳුන්වා දීම

(ඊ) රැකියා ලබා දීමේ කෝටා: රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශවල ඇබෑර්තු පිරවීමේ දී අතුරුදහන් සහ සොයාගත නොහැකි තැනැත්තන්ගේ පවුල්වල, අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති සාමාජිකයන්ට එම රැකියා අවස්ථා ලබා ගැනීම පහසුකරණය සඳහා 1%ක ප්‍රතිශතයක් වෙන් කිරීම හඳුන්වා දීම.

2.23 මෙම කාර්යාලය රාජ්‍ය පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ, අමාත්‍යාංශය, කම්කරු සහ වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ නිවාස, ඉදි කිරීම් සහ සංස්කෘතික අමාත්‍යාංශය සමග ඉහත සඳහන් නිර්දේශ පිළිබඳ පසුවිපරම් කිරීමේ පියවරක්

ආරම්භ කෙළේය. මෙම කාර්යාලය යෝජිත අතුරු සහන පියවර 2019 අයවැය ලේඛනයට ඇතුළත් කිරීම තහවුරු කිරීම සඳහා මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යංශය සමග සම්බන්ධතා පැවැත් විය.

## 3. විමර්ශන සහ පරීක්ෂණ

3.1 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන් පිළිබඳව පරීක්ෂණ පවත්වා අනාවරණය කර ගැනීමට යාන්ත්‍රණයක් සැකසීමට සහ එවැනි පුද්ගලයන් අතුරුදහන් වූ වාතාවරණය පැහැදිලි කිරීමටත් කේන්ද්‍රීය අධිකාරී බලයක් ඇත.[23] මෙම කාර්යාලය ප්‍රධාන සිද්ධීන් සම්බන්ධයෙන් ලැබෙන තොරතුරු විමර්ශනය කිරීමේ සහ පරීක්ෂණ ක්‍රියාවලිය අනුව මන්නාරම සමූහ මිනීවළ විමර්ශනයට සහාය දීම, ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යංශයට ඉදිරිපත් කරන ලද පැමිණිලි පිළිබඳ ක්‍රියා මාර්ග ආරම්භ කර ඇත.

3.2 මෙම කාර්යාලය පසුගිය මාස දහය ඇතුළත පුළුල් පරාසයක පාර්ශවකරුවන් හමුවී අතුරුදහන් සහ සොයා ගත නොහැකි තැනැත්තන්ගේ පිළිබඳ ප්‍රධාන සිද්ධීන් ගණනාවක් ගැන තොරතුරු ලබා ගෙන, පුනරීක්ෂණය කොට විශ්ලේෂණය කරන ලදී.

3.3 රාජ්‍ය ක්‍රියාකාරීන්, පැහැර ගැනීම් සහ අදාල අපරාධ සම්බන්ධ සිද්ධීන් විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට පද්ධතිගත නොහැකියාවක් සහ අකමැත්තක් දක්වන බව අපගේ අතුරු වාර්තාවේ සඳහන් කර ඇත. පැහැර ගැනීම් සහ අදාල අපරාධ සම්බන්ධ සිද්ධීන් ගැන විමර්ශන ක්‍රියාවලිය කඩිනම් කර නඩු පැවරීමට අපගේ වාර්තාවෙන් නිර්දේශ ඉදිරිපත් කෙරිණ. ඊට අමතරව බලහත්කාර අතුරුදහන් කිරීම් සම්බන්ධ වැරදි පිළිබඳව සැක කරන හෝ චෝදනා ඉදිරිපත්ව ඇති සමහර පුද්ගලයන්, විශේෂයෙන් සන්නද්ධ හමුදාවල සහ පොලිසියේ සුවිශේෂී බලය සහිත සේවා ස්ථානවල රැඳී සිටීමට අවසර දී තිබීම ගැන මෙම කාර්යාලය දැඩි කණස්සල්ල පළ කර ඇත. එමගින් ඔවුන්ට විමර්ශනයේ ප්‍රගතියට බලපෑම් කළ හැකිය.

3.4 එමෙන් ම සිදුවෙමින් පවතින විමර්ශනවලට සහයෝගය දක්වන සන්නද්ධ හමුදාවේ සහ පොලිසියේ සාමාජිකයන්ට හිරිහැර පැමිණවීම ගැන ද මෙම කාර්යාලය බරපතළ කණස්සල්ල පළ කර ඇත.

3.5 අතුරු වාර්තාවෙන් කරන ලද නිර්දේශ පිළිබඳ පසු විපරම් කිරීමේ දී මෙම කාර්යාලය, පැහැර ගැනිම් හා එම සිද්ධීන් සම්බන්ධයෙන් කෙරෙන විමර්ශන සහ නඩු පැවරීම් කඩිනම් කිරීමට පියවර ගැනීමේ දී නීතිපති වරයාගේ සහ පොලිස්පති වරයාගේ සහයෝගය ඉල්ලා සිටින ලදී. ආරක්ෂක ලේකම් මෙන්ම ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ අණදෙන නිලධාරීන්ගෙන් පැහැර ගැනීම් සහ අදාල අපරාධ සම්බන්ධ විමර්ශනවලට පූර්ණ සහයෝගය ලබා දෙන මෙන් නිර්දේශයක් ද මෙම කාර්යාලයෙන් ඉදිරිපත් කර ඇත. ඊට අමතරව මෙම කාර්යාලය එක් එක් සිද්ධීන් සම්බන්ධයෙන් මැදිහත්වී සාක්ෂිකරුවන්ට තර්ජනය කිරීම, බලපෑම් කිරීම පීඩණයට ලක් කිරීම සිදු නොවන බව සහතික කොට එවැනි සිද්ධීන් ගැන කෙරෙන විමර්ශන සහ නඩු පැවරීම් බාධාවකින් තොරව සිදු කිරීමට සහතික කරන මෙන් රාජ්‍ය බලධාරීන්ට නිර්දේශ කර ඇත.

[23] OMP Act 2(අ), 10(1))(අ) වගන්ති බලන්න.

**මන්නාරම සමූහ මිනී වළ**

3.6 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විමර්ශන බලතල අනුව මළ මිනී ගොඩ ගැනීමේ දී හෝ මිනී වලවල් කැනීමක දී නිරීක්ෂකයෙකු වශයෙන් පෙනී සිටීම සඳහා මහෙස්ත්‍රාත්වරයෙකු-ගෙන් අවශ්‍යතා ඉල්ලා සිටීමට මෙම කාර්යාලයට බලයක් ඇත.[24] ඊට අමතරව එයට මළ සිරුරු සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය බලධාරීන් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ අතුරුදහන් සහ සොයා ගත නොහැකි තැනැත්තන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ වුවමනාවන් ආරක්ෂා කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමට ද විශේෂිත අධිකාරියක් ඇත.[25]

3.7 2018 පෙබරවාරි 25 දින මන්නාරම විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි මන්නාරම නගරයේ සතොස ගොඩනැගිල්ල භූමියේ පිහිටි සමූහ මිනී වළේ කැනීම් කටයුතු ආරම්භ කෙළේය. මෙම කාර්යාලය මන්නාරම මහෙස්ත්‍රාත් අධිකරණයට කරන ලද ඉල්ලීමක් අනුව 2018 ජුනි 4 දින සැක කටයුතු මිනිවළ කැනීමේ දී නිරීක්ෂණය කිරීමට අවසර ලබා දෙන ලදී. මෙම කාර්යාලය එදින සිට කැනීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කරමින් සිටී.

3.8 2018 ජුලි මස සිට මෙම කාර්යාලය කැනීමේ කටයුතුවල යෙදෙන කණ්ඩායමේ ආහාර සහ නවාතැන් වියදම් සැපයූ අතර කැනීමේ ස්ථානය වර්ෂාවෙන් ආරක්ෂා කිරීමට වැසි ආවරණ ද ලබා දෙන ලදී. ඊට අමතරව කැනීමේ කටයුතු මහජන විශ්වාසය සහ පිළිගැනීම රැකෙන ආකාරයට සිදුවන බව තහවුරු කිරීමට අදාල බලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කරමින් සිටී.

3.9 2018 දෙසැම්බර් වන විට අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් පිරිමි, ගැහැනු සහ ළමයින් ගේ ශේෂ ඇතුළත් ඇටසැකිලි දෙසිය හැත්තෑ අටක් ගොඩ ගෙන ඇත. අධිකරණ වෛද්‍ය නිලධාරී මරණයට හේතුව, ඊට තුඩු දුන් වාතාවරණය සහ එම ස්ථානයෙන් සොයා ගත් ඇටසැකිලිවල අනන්‍යතාවය නිගමය කිරීමට සාක්ෂි රැස් කරමින් සිටී. මෙම ඇටසැකිලි අයත් වන්නේ කුමන කාල සීමාවට හෝ, සීමාවන්ටද යන්න නිශ්චය කරනු සඳහා අස්ථි සහ දත් සාම්පල කාබන් දින වකවානු ( Carbon Dating ) නිර්ණය කිරීමට යැවිය යුතුයැයි තිරණය කෙරිණ. කාබන් දින වකවානු ගණනය කිරීමේ දී දත් සහ අස්ථි සාම්පලවල ඇති කාබන් – 14 ප්‍රමාණය සැලකිල්ලට ගෙන එම සත්වයා හෝ පැලෑටිය ජීවත්ව සිටි කාලය ආසන්න වශයෙන් තහවුරු කරයි.

3.10 මන්නාරම මහෙස්ත්‍රාත්වරයාට සහ අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට සහාය වනු සඳහා මෙම කාර්යාලය අස්ථි සහ දත් සාම්පල මෙන්ම එම සාම්පල භාරයේ තබා ගැනීමේ දාමය ( Chain of Custody ) සුරක්ෂිත කිරීමේ පියවර තෝරා ගැනීමේ සහ වාර්තා කිරීමේ මාර්ගෝපදේශ ඉදිරිපත් කර ඇත. අස්ථි සහ දත් සාම්පල තෝරා ගැනීමේ ක්‍රියාවලිය 2018 දෙසැම්බර් 18 දින සිට 20 දින දක්වා එම ස්ථානයේ දි මන්නාරම මහෙස්ත්‍රාත්වරයාගේ මූලිකත්වය යටතේ සිදු කෙරිණ. අතුරුදහන් සහ සොයාගත නොහැකි තැනැත්තන්ගේ පවුල් නියෝජනය කරන නීතිඥවරු සහ මන්නාරම පුරවැසි කමිටුවේ සාමාජිකයෙක් සමග අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කොමසාරිස්වරයෙක් වන මිරාක් රහීම් මහතා සහ කේ වෙන්තන් මහතා මෙම ක්‍රියාවලිය නිරීක්ෂණය කළහ.

3.11 තෝරා ගත් සාම්පල විදේශ රසායනාගාරයක දී පරීක්ෂා කොට එහි ප්‍රතිඵල මූලික කැනීම් වාර්තාව සමග විමර්ශන කණ්ඩායම විසින් මන්නාරම මහෙස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කරනු ඇත.

---

[24] OMP Act 12(ඈ) වගන්තිය බලන්න.

[25] OMP Act 13(1)(එ) (iii) 2(ඈ) වගන්ති බලන්න.

**වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම**

3.12 වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා පද්ධතියක් ගොඩ නගා බලාත්මක කිරීමේ අධිකාරිය මෙම කාර්යාලය සතුය.[26] එය වින්දිතයන්ගෙන් සහ සාක්ෂිකරුවන්ගෙන් පැමිණිලි ලබා ගැනීමේ සහ වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටියක් සකස් කර ඇති අතර අතුරු වාර්තාවේ නිර්දේශ පසුවිපරම් කෙරේ. මෙම කාර්යාලය වින්දිතයන්, සාක්ෂිකරුවන් සහ අධිකරණය සමග සහයෝගයෙන් කටයුතු කරන අයට තර්ජනය කරන සහ බිය පත් කරවන සිද්ධීන් වැළැක්වීමට පියවර ගැනීමට මෙන්ම ඒවා විමර්ශනය කිරීමට නීතිපති, පොලිස්පති සහ ආරක්ෂක ලේකම් ගේ සහාය ඉල්ලුම් කරන ලදී.

3.13 මෙම කාර්යාලය අතුරුදහන්වීම් සහ සොයාගත නොහැකි තැනැත්තන් ගැන කටයුතු කරන අතුරුදහන් සහ සොයාගත නොහැකි තැනැත්තන්ගේ පවුල්වල සහ සිවිල් සමාජ සංවිධානවලට කෙරෙන, හිරිහැර කිරීම්, බිය වැද්දීම් සහ තර්ජනය කිරීම් පිළිබඳ එක් එක් සිද්ධීන් සම්බන්ධයෙන් අදාල බලධාරීන් සමග මැදිහත්වීම් කරන ලදී.

3.14 ඊට අමතරව අතුරුදහන්වීම් හා සම්බන්ධ එක් එක් සිද්ධීන්වලදී සාක්ෂිකරුවන්ට එල්ල විය හැකි හිරිහැර කිරීම්, බිය වැද්දීම් සහ තර්ජන පිළිබඳව පියවර ගැනීමට ආරක්ෂක බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**පැමිණිලි**

3.15 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට එම පුද්ගලයා අතුරුදහන් වූයේ හෝ සොයා ගැනීමට නොහැකි වූයේ කවදා සිට ද යන්න නොසලකා අතුරුදහන් හෝ සොයාගත නොහැකි පුද්ගලයාගේ ඥාතියෙකු හෝ වෙනත් පුද්ගලයෙකු හෝ අතුරුදහන් වුවන්ට අදාල සංවිධානයකින් ඉදිරිපත් කරන පැමිණිල්ලක් භාර ගැනීමට බලය ඇත.[27] මෙම කාර්යාලය ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යංශයට ඉදිරිපත් කර ඇති පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීම සහ සැකසීම කරන අතර නව පැමිණිලි භාර ගැනිමේ ක්‍රියා පටිපාටිය ආරම්භ කර ඇත.

3.16 2017 දී ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යංශය අතුරුදහන් සහ සොයා ගත නොහැකි පවුල් අතර ප්‍රතිපෝෂණ දත්ත පත්‍රිකා බෙදා හැර ඇත. එම දත්ත පත්‍රිකාව අනුව අතුරුදහන් පුද්ගලයෙකුගේ පවුල එවැනි පුද්ගලයන් පිළිබඳ තොරතුරු, අතුරුදහන්වීම සිදු වූ සන්දර්භය සහ වාතාවරණය, ගනු ලැබූ කිසියම් පසුවිපරම් ක්‍රියා, අපේක්ෂා කරන ප්‍රතිකර්මයේ හෝ සහනයේ ස්වභාවය පිළිබඳ විස්තර ලබා දිය යුතුය. සම්පූර්ණ කරන ලද ප්‍රතිපෝෂණ දත්ත පත්‍රිකා ප්‍රදේශීය ලේකම්වරුන්ගේ සහාය ඇතිව දිස්ත්‍රික් ලේකම්වරුන් ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යංශයට ඉදිරිපත් කර ඇත. සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන ලිපි ගොණු 14,641ක් 2018 මාර්තු 15 දින මෙම කාර්යාලයට භාර දෙන ලදී. මෙම කාර්යාලය, අමාත්‍යංශයෙන් භා දෙන ලද පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත.

3.17 මීට අමතරව මෙම කාර්යාලයට ලිපි, දුරකතන ඇමතුම්, ප්‍රධාන කාර්යාලයට පැමිණීමෙන්, ප්‍රසිද්ධ රැස්වීම් හරහා සහ අතුරුදහන් සහ සොයා ගත නොහැකි වුවන්ගේ පවුල් සමග පැවැත් වූ ඍජු සාකච්ඡා වල දී නව පැමිණිලි එකසිය විසිනමයක් ලැබිණ. ඊට අමතරව සිවිල් සමාජ සංවිධාන හරහා සහ මෙම කාර්යාලයට පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා පවුල්වලට සහාය වන නීතිඥයන් හරහා තවත් පැමිණිලි ගණනාවක් ලැබිණ. මෙම කාර්යාලයට ලැබුණු

[26] OMP Act 13(1)(උ),18 වගන්ති බලන්න.

[27] OMP Act 12(අ) වගන්තිය බලන්න.

පැමිණිලිවලට ප්‍රතිචාර දක්වා අදාල නීති උපදෙස් ලබා දී අවශ්‍ය ආකාරයට වෙනත් පරිපාලන ආධාර ලබා ගැනීමට සහාය ලබා දුන්නේය.

**අතුරුදහන් සහ සොයා ගත නොහැකි තැනැත්තන්ට අදාලව පවතින දත්ත සම්පිණ්ඩනය කිරීම**

3.18 මෙම කාර්යාලයට අතුරුදහන් සහ සොයා ගත නොහැකි තැනැත්තන්ට අදාලව දැනට සිදු කරන ක්‍රියාවලින්ගෙන් ලබා ගත් හෝ මීට පෙර වෙනත් ආයතන, සංවිධාන, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, පරීක්ෂණ කොමිෂම් සභා හා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂම මගින් සිදු කරන ක්‍රියාවලීන් තුළින් ලබා ගත් දත්ත සම්පිණ්ඩනය කිරීමට සහ ලබා ගත හැකි සියලු දත්ත මෙම පනත යටතේ ස්ථාපනය කළ දත්ත බැංකුවක මධ්‍යගත කිරීමට අධිකාරි බලයක් ඇත.[28]

3.19 මීට පෙර පැවති පරීක්ෂණ කොමිෂන් සභාවල කැමැත්තෙන් තොරව ඉවත් කිරීම් සහ අතුරුදහන්වීම්වලට අදාල වාර්තා ජනාධිපති මුද්‍රාව යටතේ වසර තිහක කාලයක් ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුවෙ හි ගබඩා කර ඇත. මෙම වාර්තාවලට එක් එක් සිද්ධියකට අදාල අතින් ලියන ලද ප්‍රකාශන සහ කාර්යාලීය ලිපි ගනුදෙනුවලට අදාල ලිපි ලේඛන ඇතුළත් ය. ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුව යනු මෙම වාර්තාවල මුල් පිටපත් තබන නිත්‍යානුකූල සුරක්ෂිතාගාරය යි.

3.20 මෙම කාර්යාලය අදාල වාර්තා බැලීමට සහ ඒවායේ දීර්ඝ කාලීන සංරක්ෂණය සඳහා සංඛ්‍යාංකනය කිරීමට අවසර ලබා දෙන ලෙස අතිගරු ජනාධිපති තුමාගෙන් සහ ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගෙන් ඉල්ලීම් කෙළෙමු.

3.21 මෙම කාර්යාලයට 2018 ජුලි මස ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුවෙවේ ගබඩා කර ඇති මුද්‍රා තබන ලද වාර්තා බැලීමට මූලික අවසරය ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබිණ. කෙසේ වුවත් අදාල වාර්තා පුනරීක්ෂණය කිරීමේ සහ සංඛ්‍යාංකනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට විධිමත් අනුමැතිය මෙතෙක් ලැබී නැත.

**දත්ත බැංකුව**

3.22 මෙම කාර්යාලය අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ සියලු විස්තර ඇතුළත් දත්ත බැංකුවක් නිර්මාණය කොට කළමනාකරණය කිරීම සහ පවත්වා ගැනීම කළ යුතුය.[29] එමෙන්ම එහි සියලු දත්ත බැංකු සහ දත්තවල ආරක්ෂාව තහවුරු කරනු සඳහා තාක්ෂණ සුරක්ෂිත භාවය ඇතුළු අවශ්‍ය සියලු පියවර ගත යුතුය.[30]

3.23 මෙම කාර්යාලය තාවකාලික දත්ත බැංකුවක් නිර්මානය කොට පැමිණිලිවලින් සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වලින් රැස්කර ගත් විවිධ ආකාරයේ දත්ත ස්ථානගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. ඒට අතුරුදහන් හෝ සොයාගත නොහැකි තැනැත්තන්ගේ පෞද්ගලික දත්ත සහ පැමිණිලිකරු, අතුරුදහන්වීමේ විස්තර සහ එය සිදු කරන ලදැයි සැලකෙන පුද්ගලයන් ඇතුළත් ය. තාවකාලික දත්ත බැංකුව මෙම කාර්යාලයේ විමර්ශනාත්මක සහ සෙවීමේ කාර්යයන් පහසු කරවීමේ දීර්ඝකාලීන අරමුණු

[28] OMP Act 10 (1)(ඉ) වගන්තිය බලන්න.

[29] OMP Act 13(1)(ඍ) වගන්තිය බලන්න.

[30] OMP Act 15(3) වගන්තිය බලන්න.

ඇතිව අතුරුදහන් පුද්ගලයන්, සිද්ධීන් සහ මිනීවළවල් පිළිබඳ අදාල තොරතුරු ඇතුලත් කෙරේ.

3.24 මෙම කාර්යාලය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ප්‍රවීනතාවයක් ඇති දත්ත සටහන් ක්‍රියාකරුවන් හය දෙනකු 2018 ඔක්තෝබර් මස බඳවා ගෙන සෑම මාසයකම පුහුණු සැසිවාර තුනක් බැගින් පවත්වන ලදී. 2018 නොවැම්බර් මාසයේ සිට දත්ත සටහන් ක්‍රියාකරුවෝ ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යාංශයෙන් මෙම කාර්යාලයට ලබා දුන් පැමිණිලිවලට අදාළ දත්ත ඇතුළත් කළහ. 2018 දෙසැම්බර් 31 වන විට ලිපි ගොණු 440ක් මෙම කාර්යාලයෙන් සකසන ලදී.

## 4. ආයතනික සංවර්ධනය

4.1 පසුගිය වසරේ මෙම කාර්යාලයේ අවධානය යොමු වූ ප්‍රධාන අභියෝගයන් වූයේ, කාර්යාල ගොඩනැගිල්ලක් ලබා ගැනීම, ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම, එහි සංවිධාන ව්‍යුහය ස්ථාපනය කිරීම සහ අභ්‍යන්තර නියමයන් සහ ක්‍රියා පටිපාටි ගොඩ නගා කාර්යාලය ක්‍රියාත්මක කිරීම යි. එහි අභ්‍යන්තර නියමයන්, ක්‍රියා පටිපාටි සහ මෙහෙයුම් නියම කිරීමේ දී මනෝ සමාජයීය ප්‍රතිචාරාත්මක මූලධර්ම මෙම කාර්යාලයේ අධිකාරී බලය අනුව ඉස්මතු කර තහවුරු කිරීම අවශ්‍ය ය.

### කාර්යාලීය ගොඩනැගිල්ලක් ලබා ගැනීම සහ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

4.2 2018 මාර්තු 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එම්.අයි.එම්. රෆික් මහතා මෙම කාර්යාලයේ ලේකම් වශයෙන් පත් කරන ලදී. කොමසාරිස්වරුන් හත් දෙනා ඇතුළු පාලක මණ්ඩලයේ පළමු රැස්වීම 2018 මාර්තු 13 වැනි දින සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී. පාලක මණ්ඩලය 2018 දෙසැම්බර් 31 දින වන විට රැස්වීම් දහයක් පවත්වා තිබුන අතර කොමසාරිස්වරුන්ගේ රැස්වීම් තිස් හතක් පවත්වා ඇත.

4.3 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ක්‍රියාත්මකවීමේ දිනය අදාල ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කළ යුතුය.[31] එමනිසා මෙම කාර්යාලය නිශ්චිත අමත්‍යාංශයක් යටතේ ගැසට් කළ යුතු විය. අමාත්‍යාංශ සහ ඒවායේ විෂයන් පසුගිය මාස අට ඇතුළත් නිරන්තරයෙන්ම වෙනස් වූ නිසා මෙම කාර්යාලයේ වගකීම පැවරුණ රේඛීය අමාත්‍යාංශයක් නැති කාල සීමා තිබූ නිසා අරමුදල් ලබා ගැනීමේ හැකියාව සීමා විය. ආරම්භයේ දී මෙම කාර්යාලය සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය යටතේ ගැසට් කරනු ලැබිණ.[32] 2018 මැයි මාසයේ දී එය ජාතික ඒකාබද්ධතා සහ සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ගැසට් කරන ලදී.[33] 2018 දෙසැම්බර් මස එය නැවතත් ජාතික සංහිඳියා, ඒකාබද්ධතා සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය යටතේ ගැසට් කරන ලදී[34].

4.4 2018 මාර්තු මාසයේ දී අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳ කාර්යාලය නාවල, නාරාහේන්පිට පාරේ අංක 34 දරණ ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යාංශ කාර්යාලයේ ස්ථාපනය කෙරිණ.

[31] 2017 සැප්තැම්බර් 12 දින 2036/21 ගැසට් පත්‍රය

[32] 2017 සැප්තැම්බර් 2036/21 ගැසට් පත්‍රය

[33] 2018 මැයි 31 2073/19 ගැසට් පත්‍රය

[34] 2018 දෙසැම්බර් 28 2103/33 ගැසට් පත්‍රය

4.5 2018 නොවැම්බර් 15 මෙම කාර්යාලය කොළඹ 7, ශ්‍රීමත් සර් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 32 දරණ ශ්‍රාවස්ති මන්දිරයට ගෙන එන ලදී. පාර්ලිමේන්තුව යටතේ පවතින මෙම ගොඩනැගිලි සංකීර්ණය අපට ලබා දුන්නේ ගරු කතානායක කරු ජයසූරිය මහතා විසිනි.

4.6 පළමු වසර මුළුල්ලේම මෙම කාර්යාලය අදාල නිපුණතා සහ පළපුරුද්ද සහිත අවශ්‍ය වූ කාර්ය මණ්ඩලය බඳවා ගැනිමට සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් වෙන් කරන ලදී. උචිත ජ්‍යෙෂ්ඨතා මට්ටමේ සහ තරගකාරී වැටුප් තලයක පිහිටුවා පුද්ගලයන් බඳවා ගැනිමට රාජ්‍ය බලධාරීන්ගේ අනුමැතිය ලබා ගැනිම මූලික අභියෝගයක් විය.

4.7 2018 මාර්තු සිට ජුනි දක්වා මෙම කාර්යාලයේ මෙහෙයම් කටයුතු සිදු කරන ලද්දේ අභ්‍යාසලාභියෙකු සහ කාර්යාල සහායකයෙකු ඇතුළත් දෙදෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකිනි. 2018 මාර්තු 29 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට තනතුරු විසි අටක් අනුමත කෙළේය. 2018 අප්‍රේල් මස සහකාර අධ්‍යක්ෂක පරිපාලන, මාධ්‍ය නිලධාරි, පර්යේෂණ සහ සහාය නිලධාරි, කළමනාකරණ සහායක හයක්, දත්ත නිවේශන ක්‍රියාකරු හයක්, භාෂා පරිවර්තක/පරිභාෂක තනතුරු එකක් සහ කාර්යාල සහායක තුනක් වශයෙන් තනතුරු විසි හතක් සඳහා දැන්වීම් පළ කරන ලදී. අයැදුම්කරුවන් තේරීම සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්විම සභාපති සාලිය පීරිස් මහතා නම් කළ කොමසාරිස්වරුන් විසින් අධීක්ෂණය කෙරිණ.

4.8 2018 මාර්තු සහ ජුනි මාසය දක්වා කාර්ය මණ්ඩල නොමැතිවීමෙන් මෙම කාර්යාලයේ සියලු වියදම් පරිපාලනය කරන ලද්දේ ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යංශයේ ගණකාධිකාරිවරයා විසිනි.[35] 2018 ජුනි 5 මුදල් සහ ප්‍රසම්පාදන අධ්‍යක්ෂකවරයෙකු පත් කිරීමෙන් පසුව එතැන් සිට සියලු වියදම් අභ්‍යන්තරව ගිණුම් ගත කරන ලදී. වැඩි දුරටත් 2018 ජුනි මස මෙම කාර්යාලයට අභ්‍යන්තර මෙහෙයුම් අධීක්ෂණය සඳහා පරිපාලන අධ්‍යක්ෂකවරයෙකු පත් කරන ලදී.

4.9 2018 අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යංශය සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමග කරන ලද දීර්ඝ ලිපි හුවමාරුවකින් පසුව අයවැය අධ්‍යක්ෂක මෙම කාර්යාලය සඳහා වාහන හතරක් අනුමත කෙළේය. ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යංශය මෙම කාර්යාලයේ පාවිච්චිය සඳහා කල් බදු ක්‍රමය යටතේ වාහන ලබා දීමේ ක්‍රියාවලියකට මුල පිරුවේය. 2018 සැප්තැම්බර් මස මෙම කාර්යාලය රියැදුරු තනතුරු සඳහා දැන්වීම් පළ කොට සම්මුඛ සාකච්ඡා පවත්වා රියැදුරන් තෝරා ගත් නමුත් තවමත් මෙම කාර්යාලය සතුව වාහන නොමැති නිසා පත්වීම් දීම් සිදු කෙළේ නැත.

4.10 දීර්ඝ කාලීනව කොළඹ ප්‍රධාන කාර්යාලයට අමතරව කලාපීය කාර්යාල හතරක් සහ උප කලාපිය කාර්යාල අටක් පිහිටුවීමට මෙම කාර්යාලය යෝජනා කරයි. මෙම සියලුම කාර්යාල ක්‍රියාත්මක කිරීමට දෙසිය පනස් හතරක ස්ථිර කාර්ය මණ්ඩලයක් අවශ්‍ය ය. අන්තර්වාර වාර්තාවෙන් මෙම වසර අවසන් වන විට මාතර සහ මන්නාරම කාර්යාල පිහිටුවීමට යෝජනා කෙරිණ. කලාපීය කාර්යාල සඳහා සුදුසු ස්ථාන ලබා ගැනිම සඳහා දැන්වීම් පළ කළ කිරීමෙන් පසුව එම ස්ථානවල යෝග්‍යතාවය පරික්ෂා කිරීමට නිරීක්ෂණ චාරිකා ද සිදු කෙරිණ. වැඩි දුරටත් මෙම කාර්යාලය, 2018 අගෝස්තු මස කාර්ය මණ්ඩල තනතුරු විසි පහක් සඳහා බඳවා ගැනිමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලුම් කෙළේය. මෙම තනතුරු විසි පහට මාතර සහ මන්නාරම කළාපීය කාර්යාල දෙක සඳහා තනතුරු දහ අටක් ද ඇතුළත් ය.

4.11 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තනතුරු නාමය, වැටුප සහ සේවා කාණ්ඩය ඇතුළත් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය අනුමත කිරීමට යටත්ව තනතුරු විසි පහක් සඳහා

[35] 2018 මැයි 31 2073/19 ගැසට් පත්‍රය

අනුමැතිය ලබා දුන්නේය. මෙම කාර්යාලය තනතුරු සඳහා යෝජිත කොන්දේසි පිළිබඳව තිබෙන ගැටළු 2018 අගෝස්තු 27 කළමනාකරණ සේවා දෙපාර්මේන්තුවට දැනුම් දුන්නේය.

4.12 තනතුරු දෙසිය විසි නමයක් පිරවීම සඳහා ඉල්ලීමක් මෙම කාර්යාලයෙන් 2018 සැප්තැම්බර් 26 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී. ඉතිරි තනතුරු විසිපහ සඳහා ඉල්ලීමක් 2018 දෙසැම්බර් මස නැවත ඉදිරිපත් කරන ලදී. 2018 සැප්තැම්බර් සහ දෙසැම්බර් අතර කාලයේ දී මෙම කාර්යාලය කාර්ය මණ්ඩල බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ දී මෙතෙක් නොවිසඳී ඇති ගැටලු විසඳා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග රැස්වීම් පහක් පවත්වන ලදී.

4.13 2018 දෙසැම්බර් 31 වන විට ඉල්ලුම් කරන ලද තනතුරු දෙසිය පනස් හතරෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇත්තේ තනතුරු පනස් හයකට පමණි. ඉතිරි කාර්ය මණ්ඩල තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීමට මෙම කාර්යාලය දිගටම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග දිගටම සම්බන්ධ වී සිටී.

## ක්‍රියා පටිපාටි සහ නියමයන් සංවර්ධනය කිරීම

4.14 මෙම කාර්යාලයට එහි කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා රීති සහ ක්‍රියා පටිපාටි සෑදීමට පැහැදිලි අධිකාරියක් ඇත.[36] මෙම කාර්යාලය පාලන මණ්ඩලය සඳහා නියමයන්, කොමසාරිස්වරුන් සඳහා ආචාර ධර්ම පද්ධතියක්, තොරතුරුවල රහස්‍ය භාවය සුරක්ෂිත කිරීමට මාර්ගෝපදේශ, අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ට අදාල නව පැමිණිලි භාර ගැනිම සඳහා ක්‍රියා පටිපාටියක්, වින්දිතයන්ගෙන් සහ සාක්ෂිකරුවන්ගෙන් පැමිණිලි ලබා ගැනීම සහ වාර්තා කිරීම සහ රඳවා ගැනීමේ ස්ථාන සොයා ගැනිම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් මෙම කාර්යාලයේ කාර්යන් සහ බලතල පාවිච්චි කිරීමට මගපෙන්වන ක්‍රියාවලියක් සංවර්ධනය කිරීමට මුලපුරා ඇත.

## මනෝසමාජ සහාය

4.15 මෙම කාර්යාලයට අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ ඥාතීන්ට පරිපාලන හෝ සුභ සාධන සේවා සහ අවශ්‍ය විටක දී මනෝසමාජ සහාය ලබා දීමට හෝ සැලැස්වීමට පැහැදිලි අධිකාරි බලයක් ඇත. මෙම කාර්යාලයේ මනෝසමාජ සේවා ලබා දීමේ ක්‍රියාදාමයට මනෝසමාජ ප්‍රතිචාරාත්මක භාවය මෙම කාර්යාලයේ පද්ධතියට හා ක්‍රියාකාරිත්වයට අන්තර්ග්‍රහණය කර ගැනීම සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල් මුහුණ දෙන මනෝසමාජ ගැටලු විසඳීම උදෙසා මෙම කාර්යාලයේ ධාරිතාවය වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. මනෝසමාජ සහායක සේවාවන් අතුරුදහන් පවුල්වල යහ පැවැත්ම වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ගරුත්වය නගා සිටුවීම සඳහා වූ මෙම කාර්යාලයේ අධිකාරි බලයේ කේන්ද්‍රීය අංගයක් වන්නේ ය.

4.16 අතුරුදහන් සහ සොයාගත නොහැකි පවුල් තම පවුලේ සාමාජිකයාට සිදු වූ දේ පිළිබඳව සත්‍යය සොයා ගැනීමේ සහ නොවිසඳී ඇති හානියේ මානසික බලපෑම සමඟ ජීවත්වීමේ අභියෝගයට මුහුණ දී සිටිති. ඒ සමගම ඔවුහු පවුල සම්බන්ධයෙන් ඇති අවිනිශ්චිත භාවයට හැඩ ගැසීම සහ සමාජයීය භූමිකාව සහ වගකීම්, ආර්ථික ප්‍රශ්න, සමාජ කැලැල් සහ කොන් කිරීම සහ ලිංගික හිරිහැර කිරීම් සහ සූරාකෑම වැනි මනෝසමාජ ගැටලු ගණනාවකට මුහුණ දෙති. අතුරුදහන් හෝ සොයාගත නොහැකි පවුලේ සාමාජිකයාට සිදු වූයේ කුමක්ද යන්න

[36] OMP Act 11(ආ),26 වගන්තිය බලන්න.

සොයා ගැනීමේ අවශ්‍යතාවය ඔවුන්ගේ ඉහළතම ප්‍රමුඛතාවය වන අතර එම පවුල්වල දෛනික ජීවිතයට බලපාන මූලික ගැටලු විසඳා ගැනීමට සහාය ද අවශ්‍ය වේ.

4.17 මනෝසමාජ සහායක කණ්ඩායම මෙම කාර්යලය ක්‍රියාත්මක වීමේ දී මනෝසමාජ ප්‍රතිචාර දැක්වීම අන්තර්ග්‍රහණය කිරිමේ උපාය, මාර්ගයක් ගොඩ නැගීමේ ක්‍රියාවලියකට මුලපුරා ඇත. කරුණු තුනකින් යුත් උපාය මාර්ගය අවධානය යොමු කරන්නේ, (අ) අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල මනෝසමාජීය වුමනාවන් සාර්ථකව හඳුණා ගැනීම, සහ ප්‍රතිචාර දැක්වීම සහ කාර්ය මණ්ඩලයේ යහ පැවැත්ම ආරක්ෂා කිරීමට මෙම කාර්යාලයේ අභ්‍යන්තර ධාරිතාව ශක්තිමත් කිරීම, (ආ) යොමු කිරීම් හරහා තම යහ පැවැත්ම තීරණාත්මකව පීඩාවට පත් අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ චිකිත්සක සහ වෙනත් මනෝසමාජ රැකවරණය කෙරේ අවධානය යොමුවීම පහසුකරණය සහ (ඇ) අතුරුදහන් සහ සොයාගත නොහැකි තම ප්‍රියයන් වටා ඇති අවිනිශ්චිත භාවය සමග ජීවත්වීමේ අභියෝග හඳුනා ගැනීමට පුළුල් ප්‍රතිපත්ති සහ සමාජ වාතාවරණයට හැකි කරවීමටය. පසුව සඳහන් කළ කරුණ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්වලට හිතකර ප්‍රතිපත්ති සහ ප්‍රජා සහාය ප්‍රවර්ධනය කිරීම දෙස ද අවධානය යොමු කරයි.

4.18 මනෝසමාජ සහායක කණ්ඩායම මනෝසමාජයීය ප්‍රතිචාරය පිළිබඳව කාර්ය මණ්ඩලයේ ධාරිතාව වර්ධනය කිරීමට වැඩ සැලැස්මක් කෙටුම්පත් කර ඇත. 2018 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල වැඩමුළු දෙකක් පවත්වන ලදී. පළමු වැඩමුළුව පැවැත් වූයේ මනෝසමාජයීය යහ පැවැත්මේ පැතිමානයන් පිළිබඳව කාර්ය මණ්ඩලයේ පොදු දැනුවත් භාවය නගා සිටුවිමට සහ මෙම දක්ම අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල් සමග කටයුතු කිරීමට ඉවහල් වන්නේ කෙසේද යන්න පිළිබඳව ය. දෙවන වැඩමුළුව මෙම කාර්යාලයේ දත්ත නිවේශන ක්‍රියාකරුවන් සඳහා ය. එහි අවධානය යොමු වූයේ සහායක කණ්ඩායමට සංවේග ජනක තොරතුරු සකස් කිරීමෙන් පැන නැගිය හැකි ආතතිය ගැන කටයුතු කිරීමට සහ එවැනි අභියෝග කළමනාකරණයේ දී ස්වයං සහ කණ්ඩායම් රැකවරණට ඉවහල් වන්නේ කෙසේද යන්න ගැනය.

4.19 අනෙකුත් ඒකකවලට තම වැඩ කටයුතු වලදී මනෝසමාජයීය සංවේදීතාවය නගා සිටුවීම මෙම කාර්යාලයේ මනෝසමාජයීය සහායක සේවාවන්ගේ වැදගත් අංගයකි. එවැනි සහාය වන්නේ මෙම කාර්යාලය පිළිබඳව ජනතාවගේ දැනුවත් භාවය නගා සිටුවීමට සන්නිවේදන ප්‍රචාරක ව්‍යාපාරයක් සැලසුම් කිරීමට ලබා දුන් සහාය සහ අතුරුදහන් සහ සොයාගත නොහැති පුද්ගලයන්ගේ පවුල් සමග කටයුතු කිරිමේ දී මනෝසමාජයීය කරුණු නීති ඒකකයට ඇතුළත් කිරීමට දෙන ලද සහායයි.

**ධාරිතාවය ගොඩනැගීම සහ දැනුම බෙදා හදා ගැනීම**

4.20 මෙම කාර්යාලය අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන් සහ මානව ශේෂ ගැන විමර්ශනය කිරීම, සංක්‍රාන්ති යුක්තිය, සංරක්ෂණය කිරීම සහ දත්ත බැංකු කළමනාකරණය ගැන දැනුම සහ විශේෂඥතාවය පිළිබඳව ජාතික සහ අන්තර්ජාතික පාර්ශ්වකරුවන් සමග පැවැත් වූ රැස්වීම් ගණනාවකට සහභාගි වූයේය. මෙම කාර්යාලය තම වැඩ කටයුතු පිළිබඳව දැනුවත්වීමට උපදෙස් ලබා ගැනීමේ අදහසින් අන්තර්ජාතික සහ ජාතික පාර්ශ්වකරුවන් සමග රැස්වීම් ගණනාවක් පැවැත් වූයේය.

4.21 ජනාධිපති ලේකම් කාර්යාලය, ගරු අගමැති තුමාගේ කාර්යාලය, ගරු කතානායක තුමාගේ කාර්යාලය, ජාතික එකමුතුව සහ සහජීවනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යංශය, සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේඛම් කාර්යාලය, අධිකරණ වෛද්‍ය නිලධාරීන්, මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් ලේකම්වරුන් මෙම කාර්යාලය රැස්වීම් පැවැත් වූ ජාතික පාර්ශ්වකරුවන් අතර වේ.

4.22 මෙම කාර්යාලය අන්තර්ජාතික රතු කුරුස කමිටුව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන සමග තාක්ෂණ සහයෝගීතාවයන් පවත්වා ගත් අතර සයිප්‍රසය, බොස්නියා සහ හර්සගොවීනා සහ ගුවන්මාලාව වැනි රටවල සමාන අධිකාරි බලයක් ඇති ආයතනවලින් උපදෙස් ලබා ගත්තේය. මෙම කාර්යාලය එක්සත් ජනපද තානාපති කාර්යාලය, ස්විට්සන්ලන්තය තානාපති කාර්යාලය, එක්සත් රාජධානිය, කැනඩාව, ඔස්ට්‍රේලියාව යන රටවල මහ කොමසාරිස් කාර්යාල සහ යුරෝපා සංගමයේ දූත කණ්ඩායම ඇතුළත් විදෙස් දූත මෙහෙයන් ගණනාවක් හමු වූයේය.

4.23 මෙම කාර්යාලය 2018 ඔක්තෝබර් 20 කොළඹ ජානකී හෝටලයේ දී කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම අභ්‍යන්තර වැඩ මුළුවක් පැවැත් වූයේය. වැඩමුළුවේ අපේක්ෂාව වූයේ අතුරුදහන් වුවන් පිළිබඳ කාර්යාලයේ අධිකාරි බලය සහ වැඩ පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සහ මෙම කාර්යාලයේ වැඩ ගැන කාර්ය මණ්ඩලයේ ප්‍රතිපෝෂණය ලබා ගැනීම ය.

4.24 ඊට අමතරව මෙම කාර්යාලයේ සභාපති, කොමසාරිස්වරුන් සහ නිලධාරීන් පහත සඳහන් අවස්ථාවන්ට සහභාගි වූහ.

| දිනය | අවස්ථාව |
|---|---|
| 2018 මාර්තු 17--19 | සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ ලේකම් කාර්යංශය සංවිධානය කළ වැඩමුළුවකට සභාපති සහ කොමසාරිස්වරු සහභාගි වූහ. |
| 2018 අප්‍රේල් 21 | කොමසාරිස්වරුන් වන මිරාක් රහීම් මහතා, මේජර් ජනරාල් (විශ්‍රාමික) මොහන්ති පීරිස් මහත්මිය සහ සභාපති සාලිය පීරිස් මහතා මරණ පරීක්ෂණ පිළිබඳ කෙටුම්පත් නීතිය ගැන අන්තර්ජාතික රතු කුරුස කමිටුව කැඳවූ අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය. ශ්‍රී ලංකාවේ ව්‍යාධිවේදීන් ගේ විද්‍යාලය, මහාධිකරණ විනිශ්චයකරුවන් සහ අධිකරණ වෛද්‍ය නිලධාරීන් සහභාගි වූ රැස්වීමක දී මෙම කාර්යාලය නියෝජනය කළහ. |
| 2018 මැයි 5 | ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ කාර්ය මණ්ඩලය සඳහා සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව පැවැත් වූ පුහුණු වැඩ සටහනකදී කොමසාරිස් මිරාක් රහීම් මහතා මෙම කාර්යාලය වෙනුවෙන් වැඩසටහයක් පැවැත් වූයේය. |
| 2018 ජුනි 26 සිට ජුලි 4 | මේජර් ජනරාල් (විශ්‍රාමික) මොහන්ති පීරිස් මහත්මිය සහ පුණ්‍යමූර්ති ජෙයදීපා මහත්මිය යන කොමසාරිස්වරුන් ස්විට්සර්ලන්තයේ මුන්චෙන්විලර් හි පැවැත් වූ ස්විස් පිස් සමග එක්ව විදේශ කටයුතු පිළිබඳ ස්විස් පෙඩරල් දෙපාර්තමේන්තුව සංවිධානය කළ ප්‍රතිපත්ති සම්පාදකයන් සහ වෘත්තිකයන් සඳහා පවත්වන ලද ''අතීතය සමග ගනුදෙනු කිරීම'' (Delight with the past) නම් පාඨමාලාවට සහභාගි වූහ. කොමසාරිස් පීරිස් මහත්මිය අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ ආයතනික රටාව, ව්‍යවස්ථාව, සංයුතිය, අධිකාරි බලය සහ බලතල ගැන කෙටි ඉදිරිපත් කිරීමක් කෙළේය. |
| 2018 ජුනි 29 | කොමසාරිස් මිරාක් රහීම් මහතා ශ්‍රී ලංකා විදේශ සේවයේ 2018 කණ්ඩායම බඳවා ගැනීමේ පාඨ මාලාවට සහභාගිවන්නන් සඳහා බණ්ඩාරණායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනයේ දී මෙම කාර්යාලය පිළිබඳ දේශනයක් පැවැත් වූයේය. |
| 2018 ජුලි 2 – 10 | කේ. වෙන්තන් මහතා, මිරාක් රහීම් මහතා, එස් කේ ලියනගේ මහතා සහ ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය යන කොමසාරිස්වරුන් සයිප්‍රසයේ අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ කමිටුව ගැන අධ්‍යයනය කිරීමට සයිප්‍රසයේ සංචාරයක යෙදුණහ. |

| | |
|---|---|
| 2018 ජුලි 21 – 22 | සභාපති සාලිය පීරිස් මහතා සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ මහ ලේකම් කාර්යාලය විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරී සහ මාධ්‍යකරුවන් සඳහා පැවති වැඩමුළුවක් ඇමතුවේය. |
| 2018 ජුලි 24 | කොමසාරිස් මිරාක් රහීම් මහතා ඇප්ගන් සිවිල් සමාජ පාර්ශ්වකරුවන් කණ්ඩායමකට මෙම කාර්යාලය සහ එය මුහුණ දී ඇති අභියෝග ගැන දේශනයක් ඉදිරිපත් කෙළේය. |
| 2018 අගෝස්තු 15 | කොමසාරිස් ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය සමානත්වය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය මෙම කාර්යාලය සහ හානිපූරණ කාර්යාලය පිළිබඳව සංවිධානය කළ වැඩමුළුවේ දී දේශනයක් ඉදිරිපත් කළාය. |
| 2018 අගෝස්තු 23 | කොමසාරිස් ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය වුලලොනීකෝන් විශ්ව විද්‍යාලයේ රොටරි සාම කේන්ද්‍රය කොළඹ සංවිධානය කළ උත්සවයක දී මෙම කාර්යාලය නියෝජනය කළාය. |
| 2018 සැප්තැම්බර් 13 | කොමසාරිස් පුණ්‍යමූර්ති ජෙයතීපා මහත්මිය සිංහල, දෙමළ සහ මුස්ලිම් පවුල් සහභාගි වූ උත්සවයකදී මෙම කාර්යාලයේ අධිකාරි බලය ගැන දේශනයක් ඉදිරිපත් කළාය. |
| 2018 සැප්තැම්බර් 21 | කොමසාරිස් පුණ්‍යමූර්ති ජෙයතීපා මහත්මිය සහ කොමසාරිස් එස් කේ ලියනගේ මහතා මෙම කාර්යාලයේ අධිකාරි බලය සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල් සමග වැඩ කිරීමේ දි ඔවුන්ගේ දැනුවත් භාවය නංවාලීම සඳහා කුරුණෑගල පැවති රැස්වීමකට සහභාගි වූහ. |
| 2018 සැප්තැම්බර් 26 | කොමසාරිස් මිරාක් රහීම් මහතා කොළඹ දී අන්තර්ජාතික රතු කුරුස කමිටුව සංවිධානය කළ මානව ශේෂ හඳුනා ගැනීම පිළිබඳ වැඩ මුළුවේ දී මෙම කාර්යාලය නියෝජනය කෙළේය. |
| 2018 ඔක්තෝබර් 2 | කොමසාරිස් ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය කොළඹ පැවති වැඩමුළුවක දී ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන් ගේ ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස් සහමුලින්ම නොඉවසීම ගැන පාර්ශ්වකරුවන්ගේ සංවාදයක දී දේශනයක් ඉදිරිපත් කළාය. |
| 2018 ඔක්තෝබර් 3 – 5 | සභාපති සාලිය පීරිස් මහතා අන්තර්ජාතික රතු කුරුස කමිටුවේ ආරාධනය පරිදි යුක්‍රේනයේ සංවිධානය කළ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ ඉරණම සහ ඔවුන් සිටින ස්ථානය පැහැදිලි කර ගැනීම සඳහා සංයුක්ත පියවර ගැනීම සහ එම පවුල්වලට සහාය ලබා දීම පිළිබඳ අන්තර්ජාතික සමුළුවට සහභාගි වූයේය. |
| 2018 ඔක්තෝබර් 12 – 15 | පුණ්‍යමූර්ති ජෙයතීපා මහත්මිය, කේ වෙන්තන් මහතා සහ මිරාක් රහීම් මහතා යන කොමසාරිස්වරුන් සිවිල් සමාජ පාර්ශ්වකරුවන් සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල් සමග, මෙම කාර්යාලයේ මනෝසමාජ ප්‍රතිචාර උපාය මාර්ග ගැන සාකච්ඡා කිරීමට මඩකලපුවේ පැවති තෙදින වැඩමුළුවකට සහභාගි වූහ. |
| 2018 ඔක්තෝබර් 23 – 26 | කේ වෙන්තන් මහතා සහ මාධ්‍ය නිලධාරි පී රුදකුමාර් මහතා බේරුවල පැවති ශ්‍රී ලංකාණ්ඩුවේ විවිධ අමාත්‍යංශවල 2019 සංහිඳියා ක්‍රියාත්මක සැලැස්ම පිළිබඳ වැඩමුළුවට සහභාගි වූහ. |
| 2018 ඔක්තෝබර් 27 | සභාපති සාලිය පිරිස් මහතා සහ කොමසාරිස්වරුන් වන මිරාක් රහිම් මහතා සහ එස් කේ ලියනගේ මහතා අතුරුදහන් වූවන්ගේ පවුල් සීදුවේ සංවිධානය කළ අතුරුදහන් වූවන් සඳහා වූ ජාතික අනුස්මරණ උත්සවයට සහභාගි වූහ. එම උත්සවයේ දි සභාපති සාලිය පීරිස් මහතා කෙටි දේශනයක් ද ඉදිරිපත් කෙළේය. |
| 2018 ඔක්තෝබර් 29 | කොමසාරිස් මිරාක් රහීම් මහතා මානව හිමිකම් කොමිසම කොළඹ දී සංවිධානය කළ ජනමාධ්‍යවේදීන්ගේ මානව අයිතිවාසිකම් දැනුවත් භාවය ගැන පැවැත් වූ සාකච්ඡා මණ්ඩපයක දී දේශනයක් ඉදිරිපත් කෙළේය. |
| 2018 නොවැම්බර් 1 | කොමසාරිස් පුණ්‍යමූර්ති ජෙයතීපා මහත්මිය කොළඹ පැවති ස්ත්‍රීපුරුෂ භාවයට සංවේදී සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලි පිළිබඳ වැඩමුළුවට සහභාගි වූවාය. |
| 2018 නොවැම්බර් 10 | කොමසාරිස් ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ සොල්දාදුවන් ගේ දෙමාපියන් ගේ එකතුවක් වන |

| | |
|---|---|
| | යුද්ධයෙන් පීඩාවට පත් ස්ත්‍රීන් සංවිධානය කළ වැඩ මුළුවක දී මෙම කාර්යාලයේ අධිකාරි බලය සහ ඉදිරියේ ඇති අභියෝග පිළිබඳව දේශනයක් ඉදිරිපත් කළාය. |
| 2018 නොවැම්බර් 19 – 23 | සභාපති සාලිය පීරිස් මහතා සහ කොමසාරිස්වරුන් වන පුණ්‍යමූර්ති ජෙයතීපා මහත්මිය සහ මේජර් ජනරාල් (විශ්‍රාමික) මොහන්ති පීරිස් මහත්මිය අන්තර්ජාතික රතු කුරුස කොමිටිය සංවිධානය කළ සයිප්‍රසයේ අතුරුදහන් වූ තැනැත්තන්ගේ කමිටුව අධ්‍යයනය කිරීමේ කමිටු සංචාරයකට සහභාගි වූහ. |
| 2018 දෙසැම්බර් 7 | කොමසාරිස් ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය ජාතික සාම මණ්ඩලය විසින් නීති ශිෂ්‍යයන්ගේ දැනුවත් භාවය නගා සිටුවීමට කැඳවන ලද පුහුණු සැසියක දී මෙම කාර්යාලයේ අධිකාරි බලය සහ මුහුණ දී ඇති අභියෝග ගැන දේශනයක් ඉදිරිපත් කළාය. |
| 2018 දෙසැම්බර් 11 | කොමසාරිස් පුණ්‍යමූර්ති ජෙයතීපා මෙනෙවිය අම්පාරේ පැවති සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වැඩමුළුවකදී මෙම කාර්යාලයේ අධිකාරි බලය ගැන දේශනයක් ඉදිරිපත් කළාය. මෙම වැඩමුළුවට සිවිල් යුද්ධයේ වින්දිතයන් සමග වැඩ කරන කාන්තාවෝ සහ මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල ගම්වල සිංහල, දෙමළ සහ මුස්ලිම් පවුල් අතර සම්බන්ධතා නිර්මාණය කිරීමට අපේක්ෂා කරන කාන්තාවෝ සහභාගි වූහ. |

## 5. ව්‍යාප්ති වැඩ සටහන්

5.1 මෙම කාර්යාලයට අතුරුදහන්වීමේ සහ පුද්ගලයන් සොයාගත නොහැකිවීමේ හේතු, සිදුවීම් සහ බලපෑම පිළිබඳව මහ ජනතාව අතර දැනුවත් භාවයක් නිර්මාණය කිරීම සහ ඔවුන්ගේ පවුල්වල අවශ්‍යතා සපුරාලීමට ජනතා සහයෝගය නිර්මාණය කිරීම සඳහා අධිකාරී බලයක් ඇත.[37] ව්‍යාප්ති වැඩ සටහන් ඒකකයේ අරමුණ වන්නේ මෙම කාර්යාලයේ අධිකාරි බලය සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල් සහ සාමාන්‍ය ජනතාව අතර කරන වැඩ පිළිබඳ දැනුවත් භාවය නගා සිටුවීම ය. එම අරමුණෙන් මෙම කාර්යාලය ප්‍රසිද්ධ ක්‍රියාකාරකම්, මාධ්‍ය වැඩ සටහන්, මාධ්‍ය ප්‍රචාරක ව්‍යාපාර සහ සංඛ්‍යාංක විද්‍යාමානතා පිහිටුවීම සිදු කෙළේය.

### ප්‍රසිද්ධ ක්‍රියාකාරකම්

5.2 මහජනතාව සහ අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල් සමග සම්බන්ධවීමේ ප්‍රයත්නයක් වශයෙන් මෙම කාර්යාලය මන්නාරම, මාතර, මුලතිවු, ත්‍රිකුණාමලය. යාපනය, කිලිනොච්චිය සහ කොළඹ ආදී වශයෙන් රටපුරා රැස්වීම් හතක් පවත්වන ලදී. එක් එක් රැස්වීමකට අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්, සිවිල් සමාජ සංවිධාන සහ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ජනමාධ්‍යවේදීහු සහභාගි වූහ. එක් එක් රැස්වීමක විස්තර පහත දැක්වේ.

[37] OMP පනත 13(i ) වගන්තිය බලන්න.

| දිනය | දිස්ත්‍රික්කය | අතුරුදහන් සහ සොයාගත නොහැකි පවුල් සාමාජිකයන් | ජනමාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ සංවිධාන |
|---|---|---|---|
| 2018 මැයි මස 11 – 12 | මන්නාරම | 300 | සිවිල් සමාජ සංවිධානවල සාමාජිකයෝ 24ක් සහභාගි වූහ |
| 2018 මැයි මස 19 | මාතර | 100 | සිවිල් සමාජ සංවිධාන සාමාජිකයෝ 23ක් සහභාගි වූහ. news.lk, වීරකේශරී, අයිබීසී දෙමළ, හිරු නිව්ස්, ශක්ති ටීවී, අල් ජසීරා යන මාධ්‍ය ආයතන නියෝජනය විය |
| 2018 ජූනි මස 1 – 2 | මුලතිවු | 40 | සිවිල් සමාජ සංවිධානවලින් සාමාජිකයෝ 16ක් පැමිණ සිටියහ. පහත සඳහන් මාධ්‍ය ආයතන නියෝජනය කරන මාධ්‍යවේදීහු පැමිණ සිටියහ. අයි ටී එන්, දෙරණ, ආදවන් ටී වී, නිව්ස් 1st යූත් එෆ් එම් Research Forum, Media SCRM. CRD |
| 2018 ජූනි මස 12 – 13 | ත්‍රිකුණාමලය | 760 | සිවිල් සමාජ සංවිධානවලින් සාමාජිකයෝ 38ක් පැමිණ සිටියහ. පහත සඳහන් මාධ්‍ය සංවිධාන නියෝජනය කරමින් මාධ්‍යවේදීහු පැමිණ සිටියහ. ලේක්හවුස්, ලංකාදීප, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ශක්ති ටී වී, බී බී සී, රූපවාහිනී, තිනකුරල් |
| 2018 ජූලි මස 14 | යාපනය | 746 | සිවිල් සමාජ සංවිධානවලින් සාමාජිකයෝ 18ක් පැමිණ සිටියහ. පහත සඳහන් මාධ්‍ය සංවිධාන නියෝජනය කරමින් මාධ්‍යවේදීහු පැමිණ සිටියහ. ඩැන්ටො, කලෙයිකතිර්, වසන්තන්, තිනකරන්, විඩිවෙලි, ශක්ති එෆ් එම්, නිව්ස් 1st |
| 2018 ජූලි මස 15 | කිලිනොච්චිය | 20 | සිවිල් සමාජ සංවිධානවලින් සාමාජිකයෝ 13ක් පැමිණ සිටියහ. පහත සඳහන් මාධ්‍ය සංවිධාන නියෝජනය කරමින් මාධ්‍යවේදීහු පැමිණ සිටියහ. කැපිටල්, උදයන්, ඩීඇල්ඩී ටී වී, අයිටීඇන්, වීරකේශරී, ලංකා සිරි, වසන්තන්, නිව්ස් 1st , නිව්ස් 1st (FM ) |

මාධ්‍ය සමග ක්‍රියාකාරකම්

5.3 මෙම කාර්යාලය 2018 දී පහත සඳහන් මාධ්‍ය නිවේදන නිකුත් කෙළේය.

| දිනය | විෂය |
|---|---|
| 2018 මැයි 22 | මුලතිවු දිස්ත්‍රික් කලාපීය රැස්වීම |
| 2018 ජූනි 06 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක කලාපීය රැස්වීම |
| 2018 ජූලි 04 | යාපනය, කිලිනොච්චිය දිස්ත්‍රික්ක කලාපීය රැස්වීම් |
| 2018 අගෝස්තු 16 | අතුරුදහන් වූවන් අනුස්මරණය පිළිබඳ ජාත්‍යන්තර දිනය |
| 2018 දෙසැම්බර් 28 | මන්නාරම සමූහ මිනීවළේ මානව ශේෂ විමර්ශනයට අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලය සහාය වේ. |

5.4 මෙම කාර්යාලය පහත සඳහන් මාධ්‍ය සම්බන්ධතා පවත්වන ලදී.

| දිනය | අවස්ථාව |
|---|---|
| 2018 මාර්තු 20 | සභාපති සාලිය පීරිස් මහතා ඩේලිමිරර් පුවත් පත සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූයේය. |
| 2018 මාර්තු 30 | සභාපති සාලිය පීරිස් මහතා ඩේලි නිවුස් පුවත්පත සමඟ සම්මුඛ සාකච්චාවක් පැවැත්තුවේ ය. |
| 2018 මාර්තු 30 | කොමසාරිස් එස්. කේ ලියනගේ මහතා රැස පුවත්පත සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූයේය. |
| 2018 අප්‍රේල් 29 | සභාපති සාලිය පීරිස් මහතා අනිද්දා පුවත්පත සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූයේය. |
| 2018 ජුලි 22 | සභාපති සාලිය පීරිස් මහතා වීරකේසරී පුවත්පත සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූයේය. |
| 2018 අගොස්තු 17 | කොමසාරිස් එස් කේ ලියනගේ මහතා අනිද්දා පුවත්පත සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූයේය. |
| 2018 අගෝස්තු 23 | සභාපති සහ කොමසාරිස්වරු ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවති ප්‍රසිද්ධ පුවත්පත් සමුළුවට සහභාගි වූහ |
| 2018 අගෝස්තු 27 | කොමසාරිස් එස් කේ ලියනගේ මහතා දිනමිණ පුවත්පත සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූයේය. |
| 2018 අගෝස්තු 31 | කොමසාරිස් මිරාක් රහීම් මහතා දි ඩේලි මිරර් පුවත්පත සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූයේය. |

**සන්නිවේදන ප්‍රචාරක ව්‍යාපාරය**

5.5 මෙම කාර්යාලය අතුරුදහන් වුවන්ගේ ජාත්‍යන්තර දිනය නිමිති කර ගෙන මුද්‍රිත මාධ්‍යයේ ශ්‍රී ලංකාවේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ ඉතිහාසය ගැන දැනුවත් කිරීම අරමුණු කර සන්නිවේදන ප්‍රචාරක ව්‍යාපාරයක් පවත්වන ලදී. එම දැන්වීම පහත සඳහන් සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි පුවත්පත් දහයේ පළ කරන ලදී. ඩේලි නිව්ස්, රාවය, ලංකාදීප, අනිද්දා, වීරකේසරී, උදයන්, වාලම්පූරි, ඩේලි මිරර්, තිනකරන් සහ දිනමිණ

5.6 මෙම කාර්යාලය ඩිජිටල්, ගුවන් විදුලිය සහ රූපවාහිනී මාධ්‍යයන් හරහා විසුරුවා හැරීමට සන්නිවේදන ප්‍රචාරක ව්‍යාපාරයක් සැලසුම් කොට නිපදවන ලදී. මෙම කාර්යාලයේ කටයුතු පිළිබඳව මහජනතාවගේ දැනුවත් භාවය නගා සිටුවිමට දැන්වීම් පහක් නිපදවන ලදී. එම දැන්වීම් මෙම කාර්යාලය පිහිටුවා වසරක් පිරීම සනිටුහන් කිරීමට 2019 ජනවාරි 5 සිට පෙබරවාරි 28 දක්වා විකාශය කිරීමට සැලසුම් කර ඇත.

**සංඛ්‍යංක විද්‍යමානත්වය ( Digital Presace )**

5.7 මෙම කාර්යාලය 2018 ජුනි 24 දින ට්විටර් හි ද, ඔක්තෝබර් 23 ෆේස්බුක් හි ද සංඛ්‍යංක විද්‍යාමානතාවයක් ස්ථාපනය කරන ලදී. 2018 දෙසැම්බර් 31 වන විට මෙම කාර්යාලයේ ෆෙස්බුක් අනුගාමිකයන් 233ක් සහ ට්විටර් අනුගාමිකයන් 870ක් ද වූහ.

5.8 මෙම කාර්යාලය තමන්ගේම වෙබ් අඩවියක් නිර්මාණය කරමින් සිටින අතර එය 2019 මුල් කාර්තුවේ දී පමණ ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 6. සැමරීම් සහ අනුස්මරණය කිරීම්

6.1 මෙම කාර්යාලයට අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ ඥාතීන්ගේ අවශ්‍යතා සපුරාලීමට මහජන සහයෝගය ලබා ගැනීම සඳහා පියවර ගැනීමට සහ අනුස්මරණය සහ පිළිගැනීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට අධිකාරිය ඇත.[38]

6.2 2018 අගෝස්තු 30, මෙම කාර්යාලය බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එරෙහිව අන්තර්ජාතික දිනය සැමරීමට කොළඹ ජේ ආර් ජයවර්ධන කේන්ද්‍රයේ සැමරුම් උත්සවයක් සංවිධානය කෙළේය. මෙය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයක් අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන් සැමරීම සඳහා උත්සවයක් පැවැත් වූ පළමු අවස්ථාවයි. රට පුරා සිවිල් සමාජ සංවිධාන, අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල්, රාජ්‍ය තාක්ත්‍රික ප්‍රජාව, පාර්ලිමේන්තු මංත්‍රීවරු සහ ආගමික ප්‍රභූවරු ඊට සහභාගි වූහ.

6.3 මානව හිමිකම් කොමිසමේ සභාපතිනිය ආචාර්ය දීපිකා උඩගම ප්‍රධාන දේශනය පැවැත් වූවාය. පුත්තලමේ පවුල් සාමාජිකයෙකු වන එම්.ෂයින්. ෂයිබුනිෂා මහත්මිය, ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ හමුදා භටයෙකුගේ මව වන විශාකා ධර්මදාස මහත්මිය, මඩකලපුවේ පවුල් සාමාජිකාවක් වන යෝගේන්ද්‍රන් වීනා මහත්මිය සහ මාතර පවුල් සාමාජිකාවක් වන අනුලා ආරියවතී මහත්මිය තම අත්දැකීම්, අතුරුදහන් සහ සොයාගත නොහැකි වූවන් සඳහා පෙනී සිටීම සහ ඔවුන්ගේ අපේක්ෂා සහ මෙම කාර්යාලය ගැන ඇති බලාපොරොත්තු ගැන අදහස් දැක් වූහ.

6.4 උත්සව සභාව ආරම්භ කිරීමට පෙර අතුරුදහන් සහ සොයාගත නොහැකි පවුල් නියෝජනය කරන සිවිල් සමාජ සංවිධාන ශ්‍රී ලංකාවේ පුළුල්ව සිදුව ඇති බලහත්කාර අතුරුදහන් කිරීම් ගැන සාමාන්‍ය ජනතාව තුළ දැනුවත්භාවය නගා සිටුවීමට විහාරමහා දේවි උද්‍යානයේ සිට ලිප්ටන් වට රවුම හරහා ජේ ආර් ජයවර්ධන කේන්ද්‍රය දක්වා පා ගමනක් ද සංවිධානය කර තිබිණ.

6.5 වැඩි දුරටත් තම අතුරු වාර්තාවෙන් අතුරුදහන් සහ සොයාගත නොහැකි පුද්ගලයන්ගේ පවුල් දීර්ඝ කාලීනව විඳ ඇති වේදනාව පිළිගැනීමක් ලෙස, අතුරුදහන් වූවන් සඳහා ජාතික දිනයක් නම් කිරීම, බත්තරමුල්ලේ පිහිටි අහිංසකයන් සඳහා වූ ස්මාරකයක් වන ''අහිංසකාරාමය'' ප්‍රතිස්ථාපනය කිරීම සහ සමූහ මිනීවළවල් අනුස්මරණ ස්ථාන ලෙස සංරක්ෂණය කිරීම ඇතුළු නිර්දේශ ගණනාවක් මෙම කාර්යාලයෙන් ඉදිරිපත් කර ඇත.

[38] OMP පනත 13(1)(j ) (k)(ii) වගන්ති බලන්න.

## 7. මූල්‍ය

### වියදම් වාර්තාව
### 2018 ජුලි සිට 2018 දෙසැම්බර් දක්වා

2018 පෙබරවාරි මස ස්ථාපනය කරන ලද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ගිණුම් 2018 ජුලි මස දක්වා පරිපාලනය කරන ලද්දේ ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා අමාත්‍යංශය විසිනි. 2018 ජුලි මස සිට මෙම කාර්යාලය එහි මූල්‍ය සහ ප්‍රසම්පාදන අංශය පරිපාලනය කිරීම ආරම්භ කෙළේය.

සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි

| | විස්තරය | එකතුව (රුපියල්) |
|---|---|---|
| 1 | ස්ථාවර වත්කම් | 7,718,695.00 |
| 2 | කාර්ය මණ්ඩල වැටුප් | 14,504,943.00 |
| 3 | සමූහ මිනිවළවල් කැනීම සහ හඳුනා ගැනීම | 1,487,545.00 |
| 4 | සන්නිවේදන | 1,094,518.21 |
| 5 | ව්‍යාප්ති වැඩ සටහන් | 2,776,290,.61 |
| 6 | කාර්ය මණ්ඩල පුහුණු | 95,750.00 |
| 7 | ප්‍රවාහන වියදම් | 537,281.00 |
| 8 | විදේශ සංචාර | 335,585,.00 |
| 9 | ගොඩනැගිලි නඩත්තුව | 835,320.00 |
| 10 | නේවාසික රැස්වීම් | 185,846.00 |
| 11 | සැපයුම් | 839,386.18 |
| 12 | වෙනත් සේවාවන් | 38,840.00 |
| | | |
| | එකතුව | 30,450,000.00 |

**2018 ජුලි 1 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාර්තු වශයෙන් වියදම්**

( සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| අංකය | විස්තරය | ජුලි – සැප්තැම්බර් | ඔක්තෝබර් - දෙසැම්බර් | එකතුව (ශ්‍රී ලංකා රුපියල් |
|---|---|---|---|---|
| 1 | ස්ථාවර වත්කම් | 196,533.00 | 7,522,162.00 | 7,718,695.00 |
| 2 | කාර්ය මණ්ඩල වැටුප් | 7,760,676.00 | 6,744,267.00 | 14,504,943.00 |
| 3 | සමූහ මිනිවළවල් කැනීම සහ හඳුනා ගැනීම | 576,785.00 | 910,760.00 | 1,487,545.00 |
| 4 | සන්නිවේදන | 691,648.00 | 403,870.21 | 1,094,518.21 |
| 5 | ව්‍යාප්ති වැඩ සටහන් | 2,425,090.61 | 351,200.00 | 2,776,290,.61 |
| 6 | කාර්ය මණ්ඩල පුහුණු | 45,000.00 | 50750.00 | 95,750.00 |
| 7 | ප්‍රවාහන වියදම් | 198,300.00 | 338,981.00 | 537,281.00 |
| 8 | විදේශ සංචාර | | 335,585.00 | 335,585,.00 |
| 9 | ගොඩනැගිලි නඩත්තුව | 236,330.00 | 598,990.00 | 835,320.00 |
| 10 | නේවාසික රැස්වීම් | 53,030.00 | 132,816,00 | 185,846.00 |
| 11 | සැපයුම් | 298,812.79 | 540,573.39 | 839,386.18 |
| 12 | වෙනත් සේවාවන් | 10,750.00 | 28,090.00 | 38,840.00 |
| | | | | |
| | | | | 30,450,000.00 |

# අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

# අතුරු වාර්තාව

2018 අගෝස්තු

## අතුරු වාර්තාව


| | | |
|---|---|---|
| | සාරාංශය | 3 |
| **1.** | අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වර්තමාන ක්‍රියාකාරීත්වයන් | 5 |
| **2.** | අභියෝග | 8 |
| **3.** | යුක්තිය තහවුරුකිරීම සඳහා වන රාජ්‍ය වගකීම | 11 |
| **4.** | හානිපූර්ණය සඳහා වන රාජ්‍ය වගකීම | 14 |
| **5.** | කඩිනම් නිර්දේශ | 15 |
| **5.1** | අතුරු සහන යෝජනා | 16 |
| **5.2** | යුක්තිය සඳහා වන නිර්දේශයන් | 17 |

## සාරාංශය


අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරවන ලද තැනැත්තන් සම්බන්ධ කාරණා නිරාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ උත්සාහයන්ගේ සුවිශේෂී සංධිස්ථානයක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම දැක්විය හැකිය. ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත මගින් පිහිටුවීමේ අරමුණු වනුයේ අතුරුදහන්වූවන් පිළිබඳ සොයා බැලීමත් එවැනි අතුරුදහන්වීම් නැවත සිදු නොවීම සඳහා නිර්දේශ ලබා දීමත් අතුරුදහන්වූවන්ගේ හා ඔවුන්ගේ ඥාතින්ගේ අයිතිවාසිකම් ආරක්ෂාකිරීම තහවුරු කිරීමත් සහන සැලසීම සඳහා සුදුසු ක්‍රමවේදයන් සකස් කිරීමත්ය.

2018 පෙබරවාරි මාසයේ කොමසාරිස්වරුන් පත්කිරීමත් සමගම මෙම කාර්යාලයේ කටයුතු ආරම්භවූ අතර කාර්යාලයේ ක්‍රියාකරීත්වය සැලසුම්කිරීම, ප්‍රාදේශීය කාර්යාල සහ ඒකක ඇති කිරීම, සේවකයන් බඳවා ගැනීම, ප්‍රතිපත්ති, රීතීන් සහ ක්‍රමවේදයන් සකස්කිරීම ඔවුන්ට පැවරිණි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරුදහන්වූවන්ගේ ඥාතීන් සමග මහජන අදහස් විමසීමේ හමුවීම්වල නිරත වුනු අතර පීඩාවන්ට ලක්වූවන්ගේ පවුල්වල ඉල්ලීම මත ඔවුන් සමග පෞද්ගලිකව හමුවීම්ද සිදුකරන ලදී. විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා නීතිය සහ වෝහාරික විද්‍යාව වැනි ක්ෂේත්‍රයන්හිද දත්ත ලේඛනගත කිරීමත් සඳහාද ජාතික මෙන්ම ජාත්‍යන්තර විද්වතුන්ගේ සහ ආයතනවල සහය ලබාගන්නා ලද අතර විවිධ රාජ්‍ය ආයතන සහ ජාත්‍යන්තර සංවිධාන සමග අවශ්‍ය සබඳතාවයන් ඇති කර ගැනීමට ද කටයුතු කරන ලදී. මේ වන විට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සුවිශේෂී සිදුවීම් කිහිපයක් සම්බන්ධයෙන් විමසීම් පැවැත්වීමටත් මන්නාරමේ සමූහ මිනීවලේ කැනීම් සහ ගොඩගැනීම් සඳහා අවශ්‍ය සහය ලබා දීමටත් මැදිහත් ව ඇති අතර අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් දැනට පවත්නා වාර්තා ඒකරාශී කිරීමත් වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල්වලට අදාළ නෛතික කාරණා සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සහ නිර්දේශ ලබාදීමත් සිදුකරන ලදී.

වසර ගණනාවක් පුරා ශාරීරික සහ මානසික පීඩනයට ලක්වී සිටින අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමේ හදිසිභාවය සංතුලනය කිරීම ද ඇතුළුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මුහුණ දෙන ලද අභියෝග බොහෝමයකි. අතුරුදහන්වූවන්ගේ පවුල්වලට අවශ්‍ය වනුයේ සිය ඥාතීන්ට සිදුවූයේ කුමක් ද යන්න දැන ගැනීමටය. මෙතෙක් මේ සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු ලබා දීමට විවිධ රාජ්‍ය යාන්ත්‍රනවලට නොහැකිවීම හේතුවෙන් රජය කෙරෙහිද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධයෙන්ද දැඩි අවිශ්වාසයක් ගොඩනැගී තිබේ. එවැනි පවුල්වල විවිධාකාර වූ අවශ්‍යතා සහ ස්ථාවරයන් තේරුම් ගනිමින් ඔවුන්ගේ විශ්වාසය ගොඩනැගීමේ අවශ්‍යතාවය අප හඳුනාගෙන ඇත.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වඩාත් ඵලදායිව පවත්වාගෙන යාම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි සහයෝගය අත්‍යාවශ්‍ය වේ. අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරන ලද අයවලුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම මගින් ඇති කරන ලද හානිය, හානිපූරණය කිරීම සඳහා වූ වැඩපිළිවෙළක් අවශ්‍ය වන්නේය. එහෙයින් හානිපූරණය කිරීම සඳහා ඵලදායි සහ විශ්වසනීය කාර්යාලයක් බවට පත් කරනු වස් නීති සම්පාදනය කිරීම ඉතා වැදගත් වේ. පවුල්වල දිවි පෙවෙත රැකබලා ගත් තැනැත්තන් අතුරුදහන්වීමෙන්, අතුරුදහන්වූවන්ගේ පවුල් පත්ව ඇති අන්ත දුක්ඛිතභාවයත් ඒ නිසාම මතුව ඇති සහන සැලසීමේ අවශ්‍යතාවයන් අප හඳුනා ගෙන ඇත. මෙම වාර්තාවට පාදක වනුයේ එම පවුල්වල අවශ්‍යතාවයන්ය. අතුරු සහන ගණනාවක් නිර්දේශ කරනුයේ එම අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය දෙමිනි. කෙසේ වෙතත් පවුල්වල සුභසාධනය අරමුණු කරගත් මෙම අතුරුසහනයන් කිසිවක් හානිපූරණය කිරීමක් නොවන බව අවධාරණය කළ යුතුය.

අතුරුදහන්වූවන්ගේ පවුල් මෙම අතුරු සහනයන් රජයෙන් භාරගැනිම හේතුකොට හානිපූරණය සඳහා ඔවුන්ට ඇති අයිතිවාසිකම් කිසිවකට එය බාධාවක් නොවන බවත් විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරන ලද තැනැත්තන් සම්බන්ධ ප්‍රශ්නය විසඳාලීම අරභයා යුක්තිය ඉෂ්ට කිරීමේ ඇති අවශ්‍යතාවය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මනාව හඳුනාගෙන ඇත. 2018 අංක 05 දරන පනත (පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එරෙහි පනත) හරහා පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය මෙරට තුළ බලගැන්වීම මගින්, බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම අපරාධයක් ලෙස හඳුනාගැනීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති රාජ්‍ය වගකීම් අවධාරණය කිරීමත් ඊට අදාළව පවතින නීතීන් හඳුනාගැනීමත් සුභවාදී පියවරයන් ලෙස අපි පිළිගනිමු. එසේ නමුත් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම අපරාධ වරදක් ලෙස ස්ථාපිත කිරීම පමණක්ම ප්‍රමාණවත් නොවන්නේය. යුක්තිය පසිඳලීම සඳහා වැදගත් වන විවිධ ක්ෂේත්‍රයන් ගණනාවක් සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණයන් අතර මේ ක්ෂේත්‍රය් කටයුතු කරන සම්බන්ධයෙන් කටයුතු කරන පවුල්වල සාමාජිකයන් ක්‍රියාධරයන් සහ මානව හිමිකම් නීතිඥයන්ට එරෙහිව සිදුවන බිය ගැන්වීම් සහ හිංසනයන් සම්බන්ධයෙන් පියවර ගැනීමේ හදිසි අවශ්‍යතාවය පිළිබඳවද නිර්දේශ කර සිටිමු.

## 1. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වර්තමාන ක්‍රියාකාරීත්වයන්

1. 2018 පෙබරවාරි මස 28 වන දින අතිගරු ජනාධිපතිතුමන් විසින් අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිතුමා සහ සාමාජිකයින්ගේ පත්වීම් ලිපි ප්‍රදානය කරන ලද අතර එතැන් සිට පසුගිය මාස හයක කාලය තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය කාර්ය භාරයන් නිසි පරිදි ඉටුකර ගැනීම සඳහාත් එහි ප්‍රධාන වැඩකටයුතු දියත්කිරීම සඳහා අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද වින්දිතයින්ගේ පවුල්වල සාමාජිකයින්ට සහන සැලසීම සඳහා ඇවැසි ව්‍යුහයන් සහ ක්‍රමවේද සකස්කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

2. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත මගින් එම කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් 4 (හතරක්) අවධාරණය කරයි. (1)අතුරුදහන්වූවන් පිළිබඳ සොයා බැලීම, අතුරුදහන්වූවන් සොයා යාම සහ එකී අතුරුදහන්වූවන්ට අත්ව ඇති ඉරණම සහ එකී අතුරුදහන්වීම්වලට අදාළ තත්ත්වයන් පැහැදිලි කිරීම (2)අතුරුදහන් කිරීම් නැවත සිදු නොවීම සහ අවම කිරීම සඳහා වගකිව යුතු ආයතන සඳහා අවශ්‍ය නිර්දේශයන් කිරීම (3)අතුරුදහන් කරවන ලද වින්දිතයින්ගේ සහ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් සහ බැඳියාවන් ආරක්ෂා කිරීම (4)සහන සැලසීම සඳහා යෝග්‍ය ප්‍රවේශයන් හඳුනාගැනීම.

3. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතට අනුව මෙම කාර්යාලය ස්ථාර කාර්යාලයකි. එමෙන්ම පනතට අනුව අතුරුදහන් වීම අර්ථ නිරූපණය වී ඇත්තේ *'යම් තැනැත්තෙකුට අත් වූ ඉරණම හෝ ඔහු සිටින ස්ථානය සාධාරණ ලෙසට නොදන්නා බවට විශ්වාස කරනු ලබන්නා වූ ද ඒ තැනැත්තා ගණනය නොවූ බවට සහ අතුරුදහන් වූ බවට සාධාරණ ලෙස විශ්වාස කරනු ලබන්නා වූද* තැනැත්තෙකි. යුදමය තත්ත්වය තුළ අතුරුදහන් වූ තැනැත්තන් ද, ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ හමුදා හෝ පොලිසියේ සාමාජිකයන් ද දේශපාලන නොසන්සුන්තාවයන් සහ සිවිල් කැරලි කෝලාහල වලදී අතුරුදහන්වූවන් ද බලහත්කාරයෙන් අතුරුදහන්කරවන ලද්දන්ද මෙයට ඇතුළත් වේ.

4. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ක්‍රියාකාරීත්වයන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය නීතිය සහ අනෙකුත් ජාත්‍යන්තර බැඳීම් මගින් ද පාලනය වේ.

### කාර්යාලය ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීම

5. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කොමසාරිස්වරුන්ට මුහුණ දීමට සිදුවූ මූලිකම අභියෝගයක් වූයේ එම කාර්යාලය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පියවර ගැනීමය. වින්දිතයන්ගේ අවශ්‍යතාවයන් කේන්ද්‍ර කර ගනිමින් සිය කාර්ය භාරයන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය වන්නාවූ ඒකකයන් පිහිටුවීම, අදාළ නීති රීති ක්‍රමවේදයන්, මාර්ගෝපදේශයන් සහ ආචාර ධර්ම පද්ධති සකස් කිරීමත් කෙරෙහි අපගේ අවධානය යොමු කර ඇත. මෙම සංකල්පගත කිරීම් සහ ක්‍රියාකාරීත්වය ආරම්භ කිරීමේ කාර්යයන් සඳහා අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අදාළ වූ පනතේ විධි විධාන, සංහිඳියා යාන්ත්‍රණයන් සඳහා වූ උපදේශන කාර්ය බලකාය ද ඇතුළත්ව මින් පෙර පත් කරන ලද කොමිෂන් සභා නිර්දේශ ද අදාළ

දේශීය මෙන්ම ජාත්‍යන්තර නීති ද අදාළ කර ගෙන ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තාවකාලික කාර්ය මණ්ඩලයක සේවය දැනටමත් ලබාගෙන ඇති අතර එයට ස්ථිර කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන ඇත. කාර්යාලය තාවකාලික වශයෙන් අංක 34, නාරාහේන්පිට පාර, නාවල යන ස්ථානයේ පිහිටුවා ඇති අතර එහි ප්‍රධාන කාර්යාලය සඳහා කොළඹ ප්‍රදේශයේ ස්ථිර ස්ථානයක් සම්බන්ධයෙන් සොයා බලමින් පවතී. ඥාතීන්ට පහසුවෙන් සිය වැඩ කටයුතු ඉටු කර ගැනීමට පහසු වන පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි ප්‍රාදේශීය කාර්යාල 12ක් විවෘත කරන අතර එහි මුල් ප්‍රාදේශීය කාර්යාල ලෙස මාතර සහ මන්නාරම් කාර්යාල මෙම වසර අවසන් වීමට පෙර ආරම්භ කරනු ඇත.

**වින්දිතයින්ගේ පවුල් සමඟ පවත්වන ලද සාකච්ඡා**

**6.** සිය සැලසුම් සකස්කිරීමේ මුල් අවස්ථාවේදීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වින්දිතයින්ගේ පවුල්වල ඥාතීන් සමග ඇති කළ සාකච්ඡාව සාර්ථක ක්‍රමවේදයක් ලෙස දැක්විය හැකිය. මන්නාරම, මාතර, මුලතිව්, ත්‍රිකුණාමලය, යාපනය සහ කිලිනොච්චි ආදී ස්ථාන හයක එවැනි සාකච්ඡා වට පවත්වන ලද අතර ඊට අමතර වශයෙන් සභාපතිවරයා සහ සාමාජිකයින් වින්දිත පවුල්වල සාමාජිකයින් කොළඹදී ද හමුවන ලදී. මෙම සාකච්ඡා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ එහි යෝජිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීමටත් ඒ සම්බන්ධයෙන් අදහස් ලබා ගැනීමටත් උපකාරි විය. මෙම සෘජු හමුවීම් මගින් විවිධ ජනවර්ගයන්ට අදාළ එකම රටක විවිධ ප්‍රදේශයන්හි වෙසෙන තමන්ගේ ආදරණීයයන් අතුරුදහන් වීමෙන් වේදනාවට පත් වින්දිත පවුල්වල අත්දැකීම්වලට සවන් දීමටත් ඔවුන්ගේ වේදනාවන් සහ අභියෝගයන් තේරුම් ගැනීමටත් ඉවහල් විය.

**7.** මෙම සංවාදයේ දී පවුල්වල සාමාජිකයන් මෙන්ම සිවිල් ක්‍රියාකාරීන් ද ජංගම කාර්යාල පිහිටුවීම, 2009 වසරේදී සන්නද්ධ හමුදාවට භාරදුන් පසු නැවත නොපැමිණි නැතහොත් අතරුදහන්ව ඇති තැනැත්තන් සෙවීමට මූලිකත්වයක් දීම සහ කඩිනම් සහන සැලසීම සඳහා පියවර ගැනීම වැනි යෝජනා ගණනාවක්ම ඉදිරිපත් කරන ලදී.

**දේශීය සහ ජාත්‍යන්තර ආයතන සමගත් රාජ්‍ය ආයතන සමගත් කරන ලද සාකච්ඡා සහ සහයෝගීතාවයන්**

**8.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ද්විපාර්ශ්වික සහ සමූහ සාකච්ඡා ගණනාවක් දේශීය සහ ජාත්‍යන්තර ආයතන සමග පවත්වා ඇත. විමර්ශනයන් සහ කැනීම්ද උත්ඛනනය (සිරුරු ගොඩගැනීම), වෝහාරික විද්‍යාව, ජානවිද්‍යාව, පවුල්වලට මනෝ සාමාජයීය සහය ලබා දීම, නීතිමය ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් මැදිහත්වීම, ලේඛනගත කිරීම්, දත්ත පද්ධති පවත්වා ගෙන යාම සහ සංරක්ෂණය සම්බන්ධ දැනුමක් ඇති පුද්ගලයන් සමගත් සාකච්ඡා පවත්වන ලදී. එසේම විවිධ රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවල අත්දැකීම් ද අදහස් ද යෝජනා ද අප ලබා ගෙන ඇත. එසේම ඒ සංවිධාන සමග කටයුතු කිරීමට අවශ්‍ය සම්බන්ධතාවයන් ගොඩනගා ගෙන ඇත. රාජ්‍ය ආයතන අතර ජනාධිපති ලේකම් කාර්යාලය, අගමැති කාර්යාලය, කතානායක කාර්යාලය, ජාතික සමගිය සහ ඒකාබද්ධතාවය පිළිබඳ අමාත්‍යාංශය, ජාතික සමගිය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය සහ සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණය පිළිබඳ ලේකම්

කාර්යාලය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික්ක ලේකම් කාර්යාල අපගේ මහජන රැස්වීම් කැඳවීමේ කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ දායකත්වයක් ලබා දෙන ලදී.

**පරීක්ෂණ සහ විමර්ශන**

**9.** අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මූලික කාර්ය භාරය වන විමර්ශන සහ සෙවීමට අදාළව අතුරුදහන් වූ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීමට අදාළ මූලික පියවරයන් ගැනීම මෙන්ම නිශ්චිත සිද්ධීන් කිහිපයක් සම්බන්ධයෙන් ඊට අදාළ ආයතන සමග විමර්ශන ආරම්භ කිරීම සඳහා යාන්ත්‍රණයන් ඇතිකිරීම පසුගිය මාස කිහිපයේදී ආරම්භ කරන ලදී. ප්‍රධාන වශයෙන් මන්නාරම සතොස ගොඩනැගිල්ලේ සමූහ මිනීවල සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මැදිහත් වෙමින් එහි ගවේෂණ සහ කැනීම් කටයුතු සඳහා මූල්‍යමය වශයෙන් ද අනුග්‍රහය දක්වන ලදී. පරීක්ෂණවල ඒකාග්‍රතාවය ආරක්ෂාකර ගැනීම සඳහා පවුල්වල විශ්වාසය තහවුරු කිරීමට සමත් වන අයුරින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එකී පරීක්ෂණ සඳහා සිය දායකත්වය දිගටම ලබා දෙනු ඇත.

**නීතිමය සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම**

**10.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, දැනට බලපවත්නා නීති සහ ප්‍රතිපත්ති සංශෝධනය කිරීමට අදාළව දියත් කර ඇති කතිකාවන්ට දායකත්වයක් සැපයීමේ අරමුණින් ඒවාට ද මැදිහත් වන ලදී. එකී ප්‍රතිසංස්කරණ මගින් බලාපොරොත්තු වන්නේ වින්දිත පවුල් තවදුරටත් අපහසුතාවයන්ට පත්වීම වළක්වාලීම තහවුරු කිරීමය. හදිසි මරණ සම්බන්ධයෙන් මරණ පරීක්ෂණ පැවැත්වීමට අදාළව ද අතුරුදහන් වීම සම්බන්ධයෙන් නිකුත් කරන සහතිකය පිළිබඳව ද ක්‍රියාමාර්ග කඩිනම් කිරීමත් මේ අතර වේ.

**අතුරුදහන්වූවන් සහ අතුරුදහන් කරන ලද අය සම්බන්ධයෙන් ලේඛනයක් සකස්කිරීම**

**11.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරුදහන්වූවන් සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන, කොමිෂන් සභා සහ සිවිල් සමාජ ක්‍රියාධරයන් විසින් රැස් කර ඇති දත්ත සියල්ල අධ්‍යයනය කර එක් ලේඛනයක් සකස් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර සිටී. කාර්යාලය මෙම වාර්තා අනුකූලකර ගැනීමේ සුවිශේෂි කාර්ය භාරය ඉටුකරමින් මධ්‍යගත ලේඛනයක් සකස්කිරීමට මැදිහත් වනු ඇත. මෙතෙක් අතුරුදහන් වූ තැනැත්තන් සංඛ්‍යාව නිශ්චිතව කිව නොහැක. මෙම අවස්ථාව වන විටත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පසුගිය කොමිෂන් සභා වාර්තාද ඇතුළුව දැනට පවත්නා දත්තයන් සහ තොරතුරු ඒකරාශී කිරීම ආරම්භකර ඇත.

## 2. අභියෝග

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පසුගිය හය මසක කාලය තුළ පහත සඳහන් අභියෝගයන්ට මුහුණ දෙන ලදී.

**විවාදශීලි සන්දර්භය**

**12.** අතුරුදහන්වූ තැනැත්තන් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවන ලද තැනැත්තන් සොයාබැලීම සම්බන්ධයෙන් සමාජයේ එක් කොටසක් විසින් ප්‍රශ්න කරන තත්ත්වයක් තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය ක්‍රියාකාරීත්වයන් ගොඩනගන්නේ මෙම විවාදශීලී සන්දර්භය තුළය. තවත් අතකින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අසීරු සන්දර්භයක් තුළ නිර්මාණය කර ඇත. එක් අතකින් යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන්වූවන් සොයා බැලීමේ අවශ්‍යතාවය තේරුම් ගත් රජය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීය. අනෙක් අතට ඓතිහාසික වශයෙන් දේශීය යාන්ත්‍රණයන්ගේ අපොහොසත්භාවයන් සහ අතුරුදහන් වීම් සහ සංක්‍රාන්තික යුක්තිය සම්බන්ධයෙන් පවතින උදාසීන බවය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්වාධීන සහ විශ්වසනීය ආයතනයක් පිහිටුවීමේ වැදගත්කම තේරුම් ගෙන ඇති අතරම එයට සමාන්තරව යුක්තිය ඉටු කර ගැනීම හා සම්බන්ධ කාරණා, සත්‍ය සොයාබැලීම, හානිපූරණය සහ විවිධ ප්‍රතිසංස්කරණ සහ සුවිශේෂී වූ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සඳහා රජය ලබා දී ඇති ප්‍රතිඥාවලින් බැඳී ඇති බැවින් රජයේ පාර්ශ්වයද ධෛර්යමත් කිරීමේ වැදගත්කම අප තේරුම් ගෙන ඇත.

**පවුල් සහ සිවිල් සමාජය අතර ඇති අවිශ්වාසය සහ සැකකිරීම**

**13.** ඵලදායි ස්වාධීන සහ විශ්වසනීය ජාතික යාන්ත්‍රණයක් ලෙස පෙනී සිටිමින් වින්දිත පවුල් අතර විශ්වාසය සහ පැහැදීම ආරක්ෂාකර ගැනීමේ ඇති අභියෝගය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වටහා ගෙන ඇත. මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයකට සහන සැලසීමට ඇති නැඹුරුව සහ හැකියාව සම්බන්ධයෙන් විශේෂයෙන්ම පවුල්වල සාමාජිකයින් තුළ ඇති අවිශ්වාසය ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කෙරෙහි සෘජුව බලපායි. මෙම අවිශ්වාසය වින්දිත පවුල් මුහුණ දෙන ලද පෙර අත්දැකීම් මත පදනම්ව ඇත.

**14.** මූලික සාකච්ඡා වටවලදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ජනයාගේ මිශ්‍ර ප්‍රතිචාරයන්ට මුහුණ දෙන ලදී. සමහර පවුල්වල සාමාජිකයින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධයෙන් දැඩි අවිශ්වාසයකින් සහ කලකිරීමකින් කතා කරන ලද අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සංවිධානය කරන ලද මහජන සාකච්ඡා පවත්වන ලද ස්ථාන ඉදිරිපිට විරෝධතා ව්‍යාපාර ද පවත්වන ලදී. නමුත් තවත් පිරිසක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධයෙන් ධනාත්මකව සහ අපේක්ෂා සහගතව කටයුතු කරන ලදී. තවත් පිරිසක් යම් යම් සීමාවන් සහිතව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමග කටයුතු කිරීමට එකඟ වන ලදී. තවත් පිරිසක් කොන්දේසි විරහිතව තමන්ට කටයුතු කිරීමට සිදුව ඇති තවත් එක් රාජ්‍ය අයතනයක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හඳුනාගෙන ඇත. තවද ඇතැම් අවස්ථාවලදී විරෝධතා දැක්වූ පිරිස තමන්ව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ

කාර්යාලය විසින් සංවිධානය කරන ලද සාකච්ඡා සඳහා සහභාගීවීම වළක්වාලීමට උත්සාහ කරන ලද බවට පැමිණිලි පවුල්වලින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත ලැබී ඇත. කෙසේ වෙතත් අතුරුදරන් වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින්ට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ එහි කටයුතු සමග සම්බන්ධවීම හෝ නොවීම සම්බන්ධයෙන් ඔවුන්ගේම තීරණ ගැනීමට ඇති අයිතිය අපි පිළිගන්නා බව නැවතත් අවධාරණය කරමු.

**15.** එකී පවුල් සිය ආදරණීයයන් අහිමිවීමෙන් දීර්ඝකාලීනව විඳින ලද වේදනාවන් අප පිළිගනිමු. එම පවුල් විසින් මේ හරහා පෙන්වා ඇති ධෛර්යය සහ අපේක්ෂාවන් ගැඹුරින් අගය කරමු.

**16.** එකී දහස් ගණනක් පවුල්වල අපේක්ෂාවන් සහ අදහස් අතර ඇති විෂමතාවයන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හඳුනාගෙන ඇති අතර උපදෙස් සහ අදහස් ලබාගැනීම සඳහා මෙන්ම ඔවුන්ගේ වැදගත් තොරතුරු ආරක්ෂා කර ගැනීමත් ඔවුන්ගේ අහිමි කරන ලද අයිතිවාසිකම් ආරක්ෂාකිරීම සඳහාත් විරෝධතා පවත්වන ලද සහ විරෝධතා පැවැත්වීමට අදහස් කර ඇති අයද ඇතුළුව සියලුම පවුල් සමගත් සිවිල් ක්‍රියාකාරීන් සමගත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දිගින් දිගටම කටයුතු කිරීමට සූදානමින් සිටින බව අවධාරණය කර සිටී.

**අනවබෝධය**

**17.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ එහි කාර්ය භාරය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විවිධාකාර වූ දුර්මතයන් සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දැනුවත්ව ඇත. එකී දුර්මතයන් අතරට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් එක් අතුරුදහන්වූවන් කණ්ඩායමක් නොසලකා කටයුතු කරන බවටත් එය අධිකරණමය යාන්ත්‍රණයක් යන කරුණුද ඇතුළත් වේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවා ඇති බව සමහර පවුල් සහ ඇතැම් රජයේ නිලධාරීන් පවා දැනුවත් නොවන අතර ඇතැම් විට එහි කටයුතු තේරුම්ගෙන ද නැත. මෙම තත්ත්වය ඉවත්කිරීම සඳහා සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව අතර අවබෝධය වර්ධනය කිරීම සඳහා කොමසාරිස්වරු විහිදී ගිය සන්නිවේදන ක්‍රමෝපායන් අනුගමනය කිරීමට සැලසුම් කර ඇත.

**පරිපාලන අභියෝග**

**18.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විවිධ වූ පරිපාලන අභියෝගයන්ට මුහුණ දෙන ලදී. ඒවා අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කටයුතු ප්‍රමාද වීමටත් අතිරේක වැඩ ප්‍රමාණයක් නිර්මාණය වීමටත් බලපෑමක් විය. ප්‍රධාන රජයේ ආයතන ගණනාවක්ම මෙම කාර්යාලය ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස හඳුනා නොගැනීම බලවත් අභියෝගයක් වන අතර එය පැහැදිලි කිරීම් සඳහා කාලය මිඩංගු වීම ඇතැම් ප්‍රමාදයන්ට හේතු විය. එසේම 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කරන ලද අනෙකුත් ස්වාධීන කොමිෂන් සභා හා සමානවම මෙම කාර්යාලයේ සභාපති සහ සාමාජිකයින්ගේ වැටුප්

පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු වන්නේය. නිලධාරීන් පත්කිරීමේ දී සහ ප්‍රසම්පාදන කටයුතු වලදී පිළිපැදිය යුතු විධි විධාන සහ අනුමැතියන් ප්‍රමාදවීම තවත් අභියෝගයකි. රාජ්‍ය ආයථන වල ක්‍රියාකාරී සහය මෙන්ම  අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ අනෙකුත් නීතින් මගින් ඇති කරන ලද ස්වාධීන කොමිෂන් සභා හා සමාන බව හඳුනාගැනීම එහි ඵලදායි ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍යය වේ.

**අඩන්තේට්ටම් කිරීම් සහ ප්‍රචණ්ඩත්වය**

**19.** අතුරුදහන් වූ තැනැත්තන්  සහ අතුරුදහන් කරවන ලද අයගේ පවුල් මුහුණ දෙන ලද විවිධ වූ හිංසනයන් සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දැනුවත්ව ඇත. පසුගිය කොමිෂන් සභා සහ සංහිඳියා යාන්ත්‍රණයන් සඳහා වූ උපදේශක කාර්ය බලකාය වෙත ලැබී ඇති මහජන පැමිණිලි අනුව වින්දිතයන්ගේ පවුල්වල සාමාජිකාවන් ලිංගික අඩන්තේට්ටම් කිරීම් සහ විවිධාකාර වූ අල්ලස් සම්බන්ධයෙන් වාර්තා කර ඇත. සමහර අතුරුදහන්වූවන්ගේ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන්ගේ පවුල්වල සමාජිකයින්ගෙන් අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමට හෝ යම් පරිපාලනමය කාරණා ඉටුකර දීම සඳහා ලිංගික අල්ලස් ඉල්ලා සිටින ලද අවස්ථා වාර්තාවී ඇත. 2018 ජූලි 06 වන දින නාඳුනන පිරිසක් විසින් අමිතා ප්‍රියන්ති මහත්මියට අලුත්ගම ප්‍රදේශයේදී එල්ල කරන ලද ප්‍රහාරය මෙන්ම 2018 ජූලි 13 වන දින වඩුක්කොඩෙයි ප්‍රදේශයේදී ශ්‍රි සෝභනා යෝගලිංගම් මහත්මියට එල්ල කරන ලද ප්‍රහාර කෙරෙහි ද අපගේ අවධානය යොමු වී ඇත. මේ අයුරින් පැමිණිලිකරුවන්, සාක්ෂිකරුවන්, අතුරුදහන්වූවන්ගේ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන්ගේ පවුල්වල සමාජිකයින්ගෙන් විමර්ශන නිලධාරීන් හා විත්තියේ නීතීඥවරුන්ට සිදුවන බිය වැද්දීම් හා ප්‍රහාරයන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය සහ රජය සම්බන්ධයෙන් ඇති විශ්වාසය බිඳ වැටීමට හේතු වන බව අපි විශ්වාස කරමු.

**20.** රජය විසින් අතුරුදහන්වූ තැනැත්තන්ට අදාළ මූලික කාරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රමාද වීමත් අතුරුදහන්වූ තැනැත්තන්ගේ සහ අතුරුදහන් කරවන ලද අයගේ පවුල්වල සමාජිකයින්ගේ අපේක්ෂාවන් මෙන්ම එකී පවුල්වල තත්ත්වය ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත නීතිගත කිරීමට තුඩුදුන් මුඛ්‍ය කාරණා වශයෙන් දැක්විය හැකිය. කෙසේ වෙතත් නැවතත් බලාපොරොත්තු කඩවීම් සිදුනොවිය යුතුය. ඒ සඳහා වඩාත් ඵලදායි සහ සංවේදී ක්‍රමවේදයන් සහ ව්‍යුහයන් හි අවශ්‍යතාවය වටහා ගනිමින් දැනුවත්භාවයකින් යුත් සංවේදී ක්‍රියාදාමයන් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වටහා ගෙන ඇත. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ සොයා බැලීම සඳහා පිහිටුවා ඇති වෙනත් ජාත්‍යන්තර සංවිධාන කෙරෙහි අවධානය යොමුකරන විට ඔවුන්ගේ කාර්ය භාරය ඉටුකිරීම සඳහා වසර ගණනාවක් ගොස් ඇති බව පෙනී යයි. පැවරී ඇති කාර්යන්ගේ සංකීර්ණභාවය තේරුම් ගනිමින්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කල්පවතින විශ්වසනීය ව්‍යුහයක් සහ ක්‍රමවේදයක් සහිතව ගොඩනැගීමට කටයුතු කරන අතරම මෙම අතුරු සහන ලබාදීම අප විසින් ගත යුතු කඩිනම් පියවරක් වශයෙන් හඳුනා ගන්නා ලදී.

**වැදගත් සාක්ෂි අහිමිවීම**

**21.** ඉදිකිරීම් කටයුතුවලදී හා කෘෂිකාර්මික කටයුතුවලදී මෙන්ම අනෙකුත් කැනීම් කටයුතුවලදී මිනිස් ඇට කැබලි කොටස් හමුවීම සම්බන්ධයෙන් විටින් විට තොරතුරු වාර්තා වන බව අපි දනිමු. බොහෝ අවස්ථාවන්වලදී මෙම තොරතුරු පොලිසියට හෝ අදාළ නිලධාරීන්ට වාර්තා නොවන්නේය. එසේ හෙයින් මෙවැනි අවස්ථාවලදී මහජනතාව මෙන්ම රාජ්‍ය ආයතන ද වඩාත් ක්‍රියාකාරීව කටයුතු කිරීමේ අවශ්‍යතාවය අපි අවධාරණය කර සිටිමු.

## 3. යුක්තිය තහවුරුකිරීම සඳහා වන රාජ්‍ය වගකීම

**22.** අතුරුදහන්වූවන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා සම්බන්ධ කටයුතු වලදී යුක්තිය ඉටු කිරීම ප්‍රධාන රාජ්‍ය වගකීමක් ලෙස පවතින බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වාස කරයි. බලහත්කාරයෙන් කරන ලද අතුරුදහන් කිරීම්වලට අදාළ වගකිවයුතු තැනැත්තන් නීතිය ඉදිරියට පැමිණවීම අතුරුදහන්වූවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සහන සැලසීමේ දී අත්‍යවශ්‍යය පියවරක් වනවා පමණක් නොව එය සමස්ත සමාජයක් ලෙසද වැදගත් වන්නේය. මන්ද කාලාන්තරයක් පුරා අතුරුදහන් කරවීමේ අපරාධය සඳහා දඬුවම් දීමක් සිදුව නැති බැවිනි. මෙම අපරාධයට දඬුවම්කිරීම දැන් නීතියෙන් බලාත්මක කර ඇත. දඬුවම් ලැබීමෙන් මිදීමට ඇති අවස්ථාව දැන් අභියෝගයට ලක්ව ඇත. යුක්තිය ඉටුකිරීමට ඇති වගකීම ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවෙන් සහ දේශීය නීති මගින් ද සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එරෙහි සම්මුතියද ඇතුළු ජාත්‍යන්තර නීතින් මගින් ද අවධාරණය කර ඇත. කලින් පැවති කොමිෂන් සභා සහ සංහිඳියා යාන්ත්‍රණයන් සඳහා වු උපදේශන කාර්ය බලකාය බලහත්කාර අතුරුදහන්කිරීම් සහ සම්බන්ධිත අයිතිවාසිකම් කඩකිරීම් සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීමත් අපරාධ නඩුකටයුතු පවත්වා ගෙන යාමටත් නිර්දේශ කර ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් හෝ අතරුදහන් කිරීම් සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියා මාර්ග ගැනීමට බලයක් නොමැති නමුත් අතුරුදහන්වීම් සම්බන්ධයෙන් වාර්තා වන අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට බැඳී සිටින අතර අපරාධයක් අනාවරණය වන්නේ නම් අදාළ නීතීය ක්‍රියාත්මක කිරීමේ සහ නඩුපැවරීමේ බලය ඇති ආයතන වෙත එම සිදුවීම් වාර්තා කිරීමේ හැකියාව පවතියි.

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ පනතා**

**23.** 2017 දෙසැම්බර් 10 වන දින ශ්‍රී ලංකාව 'සියලුම පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියට' අත්සන් තබා ඇත. බලහත්කාරයෙන් අතුරුදහන්කරවූවන් සැමරීමේ දිනය අගෝස්තු 30 වන දින යෙදී ඇති අතර එය ශ්‍රී ලංකාවට විශේෂයෙන්ම වැදගත් වන්නේ මෙම සම්මුතිය ශ්‍රී ලංකාව අපරානුමත කිරීමෙන් පසු එළඹෙන මුල්ම අතුරුදහන්කරවූවන් සැමරීමේ දිනය නිසාවෙනි.

**24.** බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට අදාළ වගකීම් දේශීය නීතී පද්ධතිය තුළ 2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලුම තැනැත්තන්

ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත (බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ පනත) මගින් ඇති කර ඇත. මෙම පනත මගින් ඉදිරිපත් කර ඇති මූලිකම කාර්ය වන්නේ අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් සොයා බැලීමත් ඔවුන් වෙනුවෙන් සහන සැලසීමත් වන අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයටද එකී වගකීමම පැවරී ඇත. ඒ අනුව මෙම පනත මගින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වඩාත් සවිබල ගන්වන අතර අතුරුදහන්වූවන්ගේ සහ අතුරුදහන් කරන ලද තැනැත්තන් සහ පවුල්වල අයිතිවාසිකම්ද වඩාත් තහවුරු කරනු ලබයි.

**25.** දශක තුනක් පුරා වින්දිතයින්, මානව හිමිකම් ක්‍රියාධරයන්, දේශපාලන ක්‍රියාකාරීන් බලහත්කාරයෙන් අතුරුදහන්කිරීම් අපරාධ වරදක් වශයෙන් පිළිගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. පවතින දේශීය නීතිය මගින් පැහැරගෙනයාම වරදක් ලෙස දක්වා තිබුණද බලහත්කාරයෙන් අතුරුදහන්කිරීම් සම්බන්ධයෙන් නඩුකටයුතු පවත්වා ගෙන යාමට සීමා කිරීම් විය. එසේ හෙයින් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම අපරාධ වරදක් ලෙස සංස්ථාපනයකිරීම ඒ සඳහා ගෙන ගිය අරගලයේ සුවිශේෂී සංධිස්ථානයකි.

**26.** ශ්‍රී ලංකාව සියලුම පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතියට අත්සන් තැබීම සහ එය දේශීය නීතිය තුළට ඇතුළත් කිරීමට ගන්නා ලද පියවර අප අගය කරන අතරම වෙනත් රාජ්‍ය ආයතනද දක්වා ඇති පරිදි බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් අපරාධයක් බව දක්වන දේශීය නීතිය ප්‍රමාණවත් නොවේ. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට අදාළ අපරාධය අර්ථ නිරූපණය, පනත සම්පාදනය කිරීමට පෙර සිටම වරදේ සමහර මූලිකාංග පැවත එන බවද ඇතුලුව වරදෙහි අඛණ්ඩ ස්වරූපය තේරුම් ගැනීමට අපොහොසත්වී ඇත. පනත අපරාධය සඳහා සහභාගීවිය හැකි අපරාධකරුවන් සම්පූර්ණ වශයෙන් ආවරණය වන පරිදි සකස් කිරීමට අපොහොසත්වී ඇති අතර පනත මගින් අණදීමේ වගකීම සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් ආවරණය කර නැත. තවද පනත මගින් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් මනුෂ්‍යත්වයට එරෙහි අපරාධයක් ලෙස හඳුනාගෙන නැත. කලින් පැවති කොමිෂන් සභා විසින් බලහත්කාරයෙන් අතුරුදහන්කිරීම් පැතිරුණු ස්වරූපයකින් ගැටුම් පැවති ප්‍රදේශවලත් ඉන් බැහැර ප්‍රදේශ වලත් සිදුවූ බවද නිගමනය කර ඇති බවට අවධානය යොමු කරවන අතර අමතර වශයෙන් මෙම පනත මගින් අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය භාරය හඳුනාගෙන නැත. අතුරුදහන් වූ තැනැත්තන්ට අදාළ පැමිණිලි සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවට කටයුතු කිරීමට ඇති බලය තහවුරු කරන ලද පරිදිම මෙම පනතින් අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වගකීමද පිළිගත යුතුය.

**පරීක්ෂණ සහ නඩු පැවරීම්**

**27.** රජයේ ඇතැම් අංශවල හැසිරීම් රටාව මගින් බලහත්කාරයෙන් අතුරුදහන්කිරීම් සඳහා දීර්ඝ කාලයක් පුරා මුක්තියක් ලැබෙන ආකාරයට කටයුතු කර ඇති බවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අවධාරණය කර සිටී. කලින් පැවති කොමිෂන් සභා සහ සංහිඳියා යාන්ත්‍රණයන් සඳහා වූ උපදේශන කාර්ය සාධක බලකාය වාර්තා කරන පරිදි එවැනි ක්‍රියාවන් සාවද්‍ය පැමිණිලි වාර්තා කිරීම හෝ වැදගත් තොරතුරු වසන් කිරීම දක්වා දිව යයි. තවද නීතිය උල්ලංඝනය කිරීමට අදාළ විශ්වසනීය සාක්ෂි තිබියදී පරීක්ෂණ පැවැත්වීමට සහ නඩුපැවරීමට ඇති නොහැකියාව සහ අකමැත්ත ද ඒ අතර වේ.

**28.** බලහත්කාරයෙන් අතුරුදහන්කිරීම් සම්බන්ධයෙන් චෝදනා ලද ඇතැම් පුද්ගලයන් විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ වගකිව යුතු බලවත් ස්ථානයන්හි සහ පරීක්ෂණ කටයුතු සඳහා බලපෑම්කළ හැකි පරිදි රැඳී සිටීමට ඉඩ සලසා දී ඇති අවස්ථා දක්නට ඇත. තවද අතුරුදහන්කිරීම් සම්බන්ධයෙන් තොරතුරු සැපයීමට කැමැත්ත දක්වන ලද හමුදා නිලධාරීන්ට හිංසනයට ලක් වූ අවස්ථාද වාර්තා වී තිබේ. පැහැරගෙන යාමට සහ අතුරුදහන්කිරීමට අදාළව දැනටමත් අධිකරණයේ විභාගවන නඩුවක චූදිත නිලධාරියෙකු සේවා තහනමකින් තොරව සන්නද්ධ හමුදාවේ රැඳී සිටීමට අවසර ලබා දී ඇත. තවත් එක් සිදුවීමක නිලධාරියෙකුට උසස්වීම් ලබා දුන් අවස්ථාවක්ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට වාර්තා වී තිබේ. පවතින රෙගුලාසි අනුවත් සාධාරණ භාවිතාව අනුවත් එවැනි නිලධාරීන්ගේ සේවය අත්හිටුවීම සහ අදාළ නිල තත්ත්වයන්හි කටයුතු කිරීමෙන් ඉවත්කිරීම සාධාරණ ලෙස අපේක්ෂාකරයි.

**29.** විවිධ අධිකරණවල වසර දහයකට වැඩි කාලයක් පවතින්නා වූ නඩු තිබෙන නමුත් එම නඩුවල වින්දිතයන්ට අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් තවමත් කිසිදු තොරතුරක් ලබා දීමට අපොහොසත් වී ඇත. මෙම නඩු අතර හබයාස් කෝපුස්, පැහැරගෙන යාම් සහ මිනී මැරීම් පිළිබඳ නඩු ඇතුළත් වේ.

**30.** මෙවැනි නඩුවල නීතිපති දෙපාර්තමේන්තුව නඩුපැවරීමේ සහ පවත්වාගෙන යාමේ ආයතනය ලෙස කටයුතු කරන අතර තවත් විටෙක හබයාස් කෝපුස් නඩුකර වලදී වගඋත්තරකරුවන් වෙනුවෙන් ද පෙනී සිටීමට සිදුවීමෙන් බැඳීයාවන් අතර ගැටුමක් නිර්මාණය වී ඇති අතර. හබයාස් කෝපුස් නඩුවලදී නීතිපති දෙපාර්තමේන්තුව මූලික අයිතිවාසිකම් ආරක්ෂා කර ප්‍රවර්ධනය කරන ප්‍රවේශයකින් රජයේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනීසිටීම හැරුණු කොට වැරදි සිදු කළා යැයි කියවෙන වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී නොසිටිය යුතු බවට දන්වා සිටිමු. හබයාස් කෝපුස් නඩුවලදී විවිධාකාරවූ මූලික විරෝධතාවයන් ඉදිරිපත් කරමින් යුක්තිය ඉටුවීමට බාධාකරන අවස්ථා අවධානයට ලක්ව ඇති අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයක් වන හබයාස් කෝපුස් පවත්වාගෙන යාමට බාධාවක් නොවිය යුතු බවට දක්වා සිටී.

**31.** කලින් පැවති කොමිෂන් සභා ගණනාවක්ම සහ සංහිඳියා යාන්ත්‍රණයන් සඳහා වූ උපදේශන කාර්ය සාධක බලකාය මෙම ව්‍යුහාත්මක වෙනස්කම් සම්බන්ධයෙන් වැදගත් නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර එවැනි කොමිෂන් සභා දෙකක්ම මානව හිමිකම් කඩ කිරීමට අදාළව ස්වාධීන නඩු මෙහෙයවන්නෙක් පත්කිරීමේ අවශ්‍යතාවය නිර්දේශකර ඇත. තවද මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා අංක 30/1 මගින් ද ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට අදාළව වෙනමම පරීක්ෂණ පැවැත්වීමේ සහ නඩු පැවරීමේ යාන්ත්‍රණයක් ඇතිකිරීමට රජයට ඇති වගකීම අවධාරණය කර ඇත.

**නිවාරණය**

**32.** බලහත්කාර අතුරුදහන්කිරීම්වලට එරෙහිව තවදුරටත් නෛතික සහ ආයතනික ප්‍රතිසංස්කරණ අවශ්‍ය බවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අවබෝධ කරගෙන සිටී. අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් රැඳවියන්ට කරනු ලබන නොකටයුතුකම් කෲර ලෙස සැලකීම් සහ අත්අඩංගුවේදී මිය යෑමට අදාළව තොරතුරු වාර්තා වී ඇත. 2016 ජූනි මාසයේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ

පනත යටතේ රැඳවියන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවන්ට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් කරන ලද විධානයන්හි වැදගත්කම අපි අවධාරණය කරමු. රැඳවියන්ගේ ලැයිස්තුවක් පවත්වාගෙන යාම මෙන්ම සියලු රැඳවුම් ස්ථාන ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම රජයේ වගකීමක් වන්නේය.

## 4. හානිපූරණය සඳහා වන රාජ්‍ය වගකීම

**33.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරුදහන් වූ තැනැත්තන් සහ ඔවුන්ගේ ඥාතීන් මුහුණ දෙන ලද භෞතික, මානසික, සමාජයීය සහ ආර්ථික හානි පිළිබඳව දැනුවත්ව සිටින අතර එකී පවුල් සඳහා හානිපූරණය කිරීම එම පවුල් සඳහා පමණක් නොව සමස්තයක් වශයෙන් අතුරුදහන් වූ සමාජයටත් එම සමාජයේ ස්ථායිතාව සහ මනා පැවැත්මටත් වැදගත් වේ.

**34.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරුදහන් වූ තැනැත්තන් සහ ඔවුන්ගේ ඥාතීන් දැඩි මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ලක්ව ඇති බවට දැනුවත්ව ඇති අතර බොහොමයක් අතුරුදහන් වූ සොයාගත නොහැකි අයවලුන්ගේ ඥාතීන් සෞඛ්‍ය දේපල නිවාස සහ අධ්‍යාපන ආදී සමාජ ආර්ථික සහ සංස්කෘතිමය අයිතිවාසිකම් දැඩි ලෙස උල්ලංඝනය කිරීම්වලට තවදුරටත් ලක්වෙමින් සිටී.

**35.** අතුරුදහන් වූ පවුල්වල සියලුම ඥාතීන් වසර 30 ක කාලයක් කිසිඳු පිළිසරණක් නොමැතිව බලවත් වේදනාවෙන් සහ පීඩාවෙන් සිය ජීවිත ගත කර ඇත. සමහර පවුල්වල සාමාජිකයන්ට කඩින් කඩ රාජ්‍ය සහයෝගය ලැබී ඇත. සිය පවුල නඩත්තු කරන්නා මෙම පවුල්වලට අහිමිව ඇති අතර එයට අමතරව බෙහොමයක් පවුල්වලට අතුරුදහන්වූවන් හිමිකම් කියනා සුභසාධන පහසුකම්, වැටුප් සහ සමාජ ආරක්ෂණයන් සඳහා අවකාශ ලැබී නැත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමහර පවුල් ලක්ව ඇති අන්ත දිළිඳුභාවය සම්බන්ධයෙන් ද අවධාරණය කර සිටී. මෙම බොහොමයක් අන්ත දිළිඳුභාවයට පත්වීම් බලහත්කාර අතුරුදහන් කරවීම්වල ප්‍රතිඵලයක් ලෙස සිදුව ඇති අතර එම බොහෝමයක් පවුල් තමන් සතු සියලුම ධනය කාලය ශ්‍රමය සිය ආදරණීයයන් සොයා ගැනීම සඳහා මිඩංගු කිරීමේ අතුරු ප්‍රතිඵලයක් ලෙස අන්ත දිළිඳුභාවයට පත්වීම් සිදු වී ඇත.

**36.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමග පවත්වන ලද සාකච්ඡාවලදී එක්වර ගෙවනු ලබන වන්දි මුදල් ප්‍රදානය නිවාස රැකියා අවස්ථා අධ්‍යාපනය සඳහා සහයෝගය මනෝ සාමාජයීය සහයෝගය සෞඛ්‍ය සේවා පහසුකම් සිහිවටන ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම ආදී වූ විවිධාකර වූ හානිපූරණ ක්‍රමවේදයන් අතුරුදහන් වූ සොයාගත නොහැකි අයවලුන්ගේ පවුල් විසින් සහ අනෙකුත් පීඩාවට පත්වූ අය විසින් යෝජනා කරන ලදී. මනෝ සාමාජයීය සහයෝගය සෞඛ්‍ය සේවා සැපයීම ආදී වු සේවාවන් සැපයීම මගින් සහ සිහිකිරීම් සහ මහජන ප්‍රකාශයන් මගින් වින්දිතයන් වෙත සමීපවෙමින් ඔවුන් මෙතෙක් අත්විදි හුදෙකලාවීම සහ වේදනාව අවම කළ හැකි වනු ඇත. අප ඉදිරිපත් කරන මෙම නිර්දේශයන් මීන් පෙර පත්කරන ලද කොමිෂන් සභාද අතුරුදහන් වූ පවුල්වල සාමාජිකයන් සමග ද සිවිල් සමාජය සහ ග්‍රාම නිලධාරීන් සමග අප විසින් කරන ලද සාකච්ඡා ද පදනම් කර සකස් කර ඇත. මෙම

නිර්දේශයන් අන්තර්කාලීන සහන සැලසීමට අදාළ වූ සීමා සහිත කාල වකවානුවක් තුළ ක්‍රියාත්මක විය යුතුය. මෙම නිර්දේශයන් ඉදිරිපත් කරන්නේ සත්‍ය සෙවීම සහ යුක්තිය සඳහා වන ඔවුන්ට ඇති අයිතිය ද සහතික කරමින් පිළිගනියි. එසේම අන්තර්කාලීන සහන ලබා ගැනීමත් වන්දිපූරණය සඳහා ඇති අයිතියත් යුක්තිය ඉටුකරවා ගැනීමටත් වින්දිතයන්ට පූර්ණ වශයෙන් අප සහතික කළ යුතුය.

**හානිපූරණය සඳහා වන නෛතික වගකීම**

**37.** හානිපූරණයන් ඉලක්ක කරගන්නේ සිය මානව හිමිකම් උල්ලංඝනය කිරීම් මගින් ඇති වූ වේදනාවන් සමනය කිරීම සඳහා වේ. හානිපූරණය යන්නට යථා තත්ත්වයට පත්කිරීම, වන්දි, පුනරුත්ථාපනය, සංතෘප්තිය සහ නැවත සිදුනොවීමට වන පොරොන්දුව ඇතුළත් වේ. ශ්‍රී ලංකාවට වින්දිතයන් සඳහා හානිපූරණය කිරීමට දේශීය මෙන්ම ජාත්‍යන්තර වගකීමක් ඇත.

**38.** ශ්‍රී ලංකාවේ නීතිය යටතේ 2015 අංක 4 දරන වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරැකීමේ පනත මගින් වින්දිතයන්ට ඔවුන් විඳින ලද හානි සම්බන්ධයෙන් හානිපූරණය කිරීමේ වගකීමක් ඇත. බලහත්කාරයෙන් අතුරුදහන් කරවූවන් සම්බන්ධ පනත මගින් ද අතුරුදහන් කරවූවන්ට වින්දිතයන්ට වන්දි ගෙවන ලෙස අධිකරණ විසින් නියෝග කළ හැකිය.

**39.** යෝජිත හානිපූරණය කිරීමේ කාර්යාලය මගින් අර්බුදවලදී පීඩාවට පත්වූවන් සහ සියලු අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් හානිපූරණය කිරීමේ දී සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරනු ඇත. දැඩි කාර්ය භාරයක් සහ ක්‍රියාත්මක කිරීමේ විශාල බලයක් සහිත ස්වාධීන කාර්යාලයක් නොපමාව ස්ථාපනය කිරීම අවශ්‍යව ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හානිපූරණය සඳහා වූ කාර්යාලය පිලිබඳ පනත් කෙටුම්පත ශක්තිමත් කරන ලෙසත් එය මනා ලෙස සම්මත කිරීම තහවුරු කරන ලෙසත් එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටී.

## 5. කඩිනම් නිර්දේශ

**40.** අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන අභිමතාර්ථය වන්නේ අදාළ අධිකාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමත් අතුරුදහන්වීම් සම්බන්ධ සිදුවීම් සංඛ්‍යාව අවම කිරීමත් වින්දිතයන්ගේ සහ පවුල්වල උපරිම යහපත කේන්ද්‍රකරගත් සහන සැලසීමේ ක්‍රමවේදයක් හඳුනාගැනීමත් වන අතර විශේෂයෙන්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම, හානිපූරණය, යළි සිදුනොවීමට වගබලාගැනීම සහ නෛතික ප්‍රතිසංස්කරණ සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කිරීමට බලයක් ඇත. තවද අතුරුදහන්වූවන් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවනු ලැබූවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා අතුරු සහන සහ සුභසාධන ක්‍රම යෝජනා කිරීමටද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත මගින් ප්‍රතිපාදන සලසා ඇත.

**41.** අතුරුදහන්වූවන්ගේ පවුල්වල වර්තමාන සමාජ ආර්ථික තත්ත්වයන් ඉතා දුක්ඛිත වන අතර අවසන් හානිපූරණ ක්‍රියාවලියක් ආරම්භ වනතෙක් බලාසිටීමට

කොහෙත්ම හැකියාවක් නැත. අතුරුදහන්වූවන් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවනු ලැබූවන් ගේ පවුල් වල සාමාජිකයන් සඳහා හදිසි සහ ආසන්නතම සහන ලෙස අතුරු සහන සැපයීම අත්‍යාවශ්‍ය වේ.

**42.** අමතර වශයෙන් බලහත්කාරයෙන් කරන ලද අතුරුදහන්කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකිරීම හා අපරාධ නඩු පැවරීම සම්බන්ධයෙන් නොසලකා හැරිය නොහැකි ඉල්ලීමක් සහ අවශ්‍යතාවයක් පවතී. මේවා අතීතයේ සිදු වූ අපරාධ පමණක් නොව අතුරුදහන්වූවන් පිළිබඳ ඔවුන්ගේ ඥාතීන්ට අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් යම් තොරතුරක් ලැබෙන තුරුම අඛණ්ඩව පවත්නා ඒවා වේ. එසේ හෙයින් රජය විසින් ප්‍රමාණවත් නෛතික රාමුවක් නිර්මාණය කිරීමේ සහ අදාළ රජයේ ක්‍රියාකාරීන් පරීක්ෂණ කටයුතු සහ නඩු පවරා පවත්වාගෙන යාමේ සහ බලගැන්වීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී.

## 5.1. අතුරු සහන යෝජනා

**43.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහන සහ හානිපූරණය පිළිබඳ වෙනස සම්බන්ධයෙන් අවධාරණය කර සිටී. සහන යනු පීඩාවට පත්වූවන් ආර්ථික සමාජීය සහ ඔවුන් මුහුණ දෙන අනෙකුත් වගකීම්වලින් මුදවාලමින් ඔවුන් සමනය කිරීම සඳහා ලබාදෙන හදිසි උපකාරයන් වන අතර හානිපූරණයන් යනු අයිතිවාසිකම් කඩවීමෙන් වූ හානිය යථාවත්කිරීම සඳහා එකී අයිතිවාසිකම් අහිමිකිරීම හේතුවෙන් රජයට ඇති වගකීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලබාදෙන්නක් වේ.

**44.** සහන ලබා ගැනීම නිසි ප්‍රමාණවත් ඵලදායි හානිපූරණයක් සඳහා වන අයිතිවාසිකම කිසිසේත්ම අහිමි නොකරන අතර අධිකරණමය ප්‍රතිකර්මයන් මගින් වගවීමට ලක්කිරීමට ඇති අයිතියට කිසිඳු සීමාකිරීමක් ඇති නොකරයි. පෙර වන්දි ලබාදීමේ ක්‍රියාවලින් විසින් වින්දිතයන් අතර අවිශ්වාසය ඇතිවීමටත් සත්‍ය සහ යුක්තිය ඉටුකිරීමට රජයේ ඇති කැමැත්ත සම්බන්ධයෙන් සැකයක්ද නිර්මාණය කරන ලදී.

**45.** අප විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති නොපමාව සකස් කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

අ)**මූල්‍ය ආධාර වැඩසටහනඃ** මූල්‍ය ආධාර වැඩසටහනක් සකස්කරමින් ස්ථිර ආදායම් මාර්ගයක් නැති අතුරුදහන්වූ / බලහත්කාරයෙන් අතුරුදහන් කරවනු ලැබූවන්ගේ ජීවතුන් අතර සිටින බිරිඳට/ දරුවා/ දරුවන්ට සහ/හෝ ජීවතුන් අතර සිටින දෙමපියන්ගෙන් කෙනෙකුට/ දෙමපියන්ට මාසික ජීවන දීමනාවක් වශයේ රුපියල් හයදහස (6000/-)ක මුදලක් ලබා දීම. මෙය අතුරු සහනයක් වශයෙන් ලබා දිය යුතු අතර අවසන් හානිපූර්ණයෙන් පසු නැවැත්විය හැක.

ආ) **ණය සහන වැඩසටහනඃ** අතුරුදහන්වූ සහ අතුරුදහන් කරවන ලද අයගේ පවුල් වෙනමම කාණ්ඩයක් යටතේ ඇතුළත් කොට (අ)මුදල් අමාත්‍යංශය විසින් තීරණය කරනු ලබන ණය සිමාවන්ගෙන් ඉවත් කිරීම (උදාහරණයක් ලෙස ශුද්ධ මූල්‍ය ණය) (ආ)ආර්ථික ස්ථායිතාව සහ ස්වයං රැකියාව වර්ධනය සඳහා මුදල් අමත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන 'Enterprise Sri Lanka' ව්‍යවසායක ණය යෝජනාවලියක් මගින් ණය සහන සැපයීම.

ඇ) **නිවාස සංවර්ධනය කිරීමේ වැඩසටහනඃ** අතුරුදහන්වූ තැනැත්තන් සහ අතුරුදහන් කරවන ලද අයගේ ගේ පවුල් වෙනමම කාණ්ඩයක් ලෙස ඇතුළත් කොට නිවාස අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති වලින් නිවාස සැපයීම හෝ අඩක් නිමකරන ලද නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා මූල්‍ය ආධාර ලබා දීම.

ඈ) **අධ්‍යාපන කටයුතු සඳහා සහන ලබාදීමේ වැඩසටහනඃ** අතුරුදහන්වූ තැනැත්තන් ගේ සහ අතුරුදහන් කරවන ලද අයගේ පවුල්වල දරුවන් සඳහා ඔවුනගේ මූලික සහ ද්වීතියීක අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සඳහා අත්‍යාවශ්‍ය වියදම් වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යංශය යටතේ ශිෂ්‍යත්ව වැඩසටහනක් ඇති කරමින් මාසිකව රුපියල් දෙදහස (2000/-)ක ආධාර මුදලක් ලබාදීම.

ඉ) **වෘත්තීය පුහුණු සහ ජීවන තත්ත්වය වර්ධනය කිරීමේ වැඩසටහනඃ** රැකියාවේ නියුක්ත අතරවාරයේ පුහුණුවද ඇතුළත් වෘත්තීය තාක්ෂණික පුහුණු පාඨමාලා හඳුන්වාදීම.

ඊ) **විශේෂ රැකියා අවස්ථා ලබා දීමඃ** රාජ්‍ය අංශයේ රැකියා අවස්ථාවලින් කිසියම් ප්‍රතිශතයක් එනම් 1% ක් අතුරුදහන්වූ සහ අතුරුදහන් කරවන ලද අයගේ පවුල්වල සුදුසුකම් සුපුරා ඇති සාමාජිකයන් සඳහා වෙන් කිරීම.

**46.** මෙම සහන සඳහා අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතේ අර්ථ නිරූපණයට අනුව අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන්ට පමණක් හිමිකම් කියනු ලබන අතර එය යුද්ධයෙන් අනතුරුව අතුරුදහන් වූ සිවිල් කලබලවලදී අතුරුදහන් වූ ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවන ලද තැනැත්තන් ද ඇතුළත් වේ. මෙම සහන බොහෝ සෙයින් පීඩාවට ලක්වූ එනම් දෙමවුපියන්ගෙන් එක් අයෙකු පමනක් ජීවත්ව සිටින, කුඩා දරුවන් සිටින, යැපෙන්නන් සිටින, ආබාධිත තැනැත්තන් සහ වැඩිහිටි තැනැත්තන් ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූවන් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වමින් ලබා දීම යෝග්‍ය ලෙස සලකමු.

## 5.2. යුක්තිය සඳහා වන නිර්දේශයන්

**47.** යුක්තිය සහ වගවීම සඳහා වන හදිසි අවශ්‍යතාවය වටහා ගනිමින් නිසි සහ ඵලදායි පරීක්ෂණ සහ නඩු පැවරීමේ ක්‍රියාවලියක් තහවුරු කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පහත නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.

**අතුරුදහන්වූවන්ගේ පනත බල ගැන්වීම**

අ) අතුරුදහන්වීම්වල අඛණ්ඩතාවය හඳුනාගැනීම සහ අපරාධයේ යම් සංඝටකයන් පනත බලාත්මක වීමට පෙර සිදුකරන ලද අවස්ථාද ඇතුළත් කිරීම.

ආ) පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරමින් සියලු ආකාරයේ වගකිව යුත්තන් ආවරණය වන පරිදි බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්ද ඇතුළත් වන ලෙස පනත සංශෝධනය කිරීම. විශේෂයෙන්ම නිදහස අහිමි කිරීම මෙන්ම නිදහස අහිමි කරන ලද බවට නොපිලිගැනීමද බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වරදට ඇතුළත් විය යුතුය.

ඇ) බලහත්කාර අතුරුදහන් කිරීම් මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස හඳුනාගැනීම.

ඈ) පනතේ 3(3) වන වගන්තිය සංශෝධනය කරමින් සියලු ආකාරයේ අණදීම් වගකීම් වශයෙන් ඇතුළත්කිරීම සහ විශේෂයෙන්ම බලහත්කාර අතුරුදහන්කිරීම් සඳහා අණදීම් ඇතුළත් කිරීම.

ඉ) පනතේ 15(3) වන වගන්තිය සංශෝධනය කරමින් මානව හිමිකම් කොමිෂන් සභාව සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමග අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පුද්ගල නිදහස සීමා කරන ලද ස්ථානවලට ප්‍රවේශවීමට අයිතිය ලබාදීම.

ඊ) පනතේ 15 වන වගන්තිය සංශෝධනය කරමින් රැඳවියන්ගේ නම් නිල ලේඛනයට ඇතුළත් කිරීමට අදාළව නිශ්චිත කාලරාමුවක් නියම කිරීම සහ චේතනාන්විතව නොකරසිටීම හෝ එකී ලේඛනයට නම් ඇතුළත් කිරීමට බාධා කිරීමට අදාළව දඬුවම් හඳුන්වා දීම.

උ) පනතේ 20(3) වන වගන්තිය සංශෝධනය කරමින් අදාළ පෙත්සම් මහාධිකරණයට, මානව හිමිකම් කොමිෂන් සභාවට මෙන්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට  යොමු කිරීමට අවස්ථාව ලබාදීම.

ඌ) පනතේ 20(3) වන වගන්තිය සංශෝධනය කරමින් කොළඹ මහාධිකරණයට ලබාදී ඇති අනන්‍ය අධිකරණ බලය ඉවත් කොට අපරාධය සිදුකරන ලද ප්‍රදේශයට අයත් මහාධිකරණයට අධිකරණ බලය ලබාදීම.

**පරීක්ෂණ පැවැත්වීම සහ නඩුපැවරීම**

එ) බලහත්කාර අතුරුදහන්කිරීම්වලට අදාළව නඩු පැවරීම කඩිනමින් අවසන්කිරීම සහ නඩු පවත්වාගෙන යාමට මූලිකත්වය ලබාදීම.

ඔ) සියලු ආකාර අයුතු අත්අඩංගුවට ගැනීම් වධබන්ධනයට ලක්කිරීම් සහ අත්අඩංගුවේදී මියයාම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම.

ඕ) බලහත්කාර අතුරුදහන්කිරීම්වලට සහ පැහැර ගෙන යාම්වලට අදාළ යම් අපරාධ නඩුවක චූදිතයෙකු හෝ සැකකරුවකු ලෙස නම්කර ඇති රාජ්‍ය නිලධාරියෙකු සන්නද්ධ හමුදා සාමාජිකයෙකු හෝ පොලිසියේ නිලධාරියෙකුගේ සේවය අදාළ නඩුව අසා අවසන් වනතුරු අත්හිටුවීම. සන්නද්ධ හමුදා හෝ පොලිසියේ සාමාජිකයෙකු සේවාස්ථානයෙන් මාරුකිරීම වෙනුවට ඔහුව තාවකාලිකව සේවයේ යෙදවීම නතර කළ යුතු අතර ඔහු උසස්කිරීම හෝ වෙනත් කිසිඳු නිලයක් ලබාදීම ඔහුගේ නඩුව අවසන් වනතුරු නොකළ යුතුය.

ඖ) මිනිස් ඇටසැකිලි සහ මෘත ශරීර හඳුනාගැනීම තහවුරු කිරීම සඳහා දැනට පවත්වා ගෙන යන මරණ පරීක්ෂණවලට අදාළ නීති සංශෝධන කඩිනම් කිරීම සහ මෘත ශරීර සොයා ගැනීම හා හඳුනාගැනීමේ කටයුතුවල නිරත වන බහුවිධ ආයතන අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීම.

ක) අතුරුදහන් කරවීම්වලට අදාළව පරීක්ෂණ පැවැත්වීම, නඩුපැවරීම සහ දඬුවම් දීම සඳහා ප්‍රමාණවත් ද්‍රව්‍යමය සහ මානව සම්පත් නීතිය ක්‍රියාත්මක

කරන නිලධාරීන්ට නීතිපති දෙපාර්තමේන්තුවට අධිකරණයට ලබාදීම. ඇට සැකිලි සහ මිනිස් ශරීර කොටස් පිළිබඳව රජයේ නිලධාරීන්ට දැනුම්දීමේ අවශ්‍යතාවය නීතිගත කිරීම සහ ඒ පිළිබඳව මහජනයා දැනුවත් කිරීම.

ග) ගොඩනැගිලි තැනීමේ දී සහ විවිධ කැනීම් කටයුතුවලදී මතු වන මිනිස් ඇටසැකිලි සහ ශරීර කොටස් පිළිබඳව රජයේ නිලධාරීන්ට දැනුම් දීම සම්බන්ධයෙන් ඊට අදාළව රෙගුලාසි සකස් කරදීම.

**නිවාරණය**

ච) පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමේදී සහ රඳවා තබාගැනීමේදී නිසි ක්‍රියාදාමය අනුගමනය කිරීම.

ඩ) රැඳවියන්ගේ නාම ලේඛනයක් පවත්වාගෙන යාම සහ රැඳවුම් මධ්‍යස්ථානවල ලේඛනයක් පවත්වාගෙනයාම පිළිබඳ ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමත් ද

ට) අධිකරණ පුනරීක්ෂණයකින් තොරව සැකකරුවන් සහ චූදිතයන් දීර්ඝකාලයක් තිස්සේ රඳවා තබා ගැනීමට හැකි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන ඉවත්කිරීම හෝ සංශෝධනය.

## සිහි කිරීම සඳහා කඩිනම් නිර්දේශ

**48.** අතුරුදහන්වූ සිය ආදරණීයයන් පිළිබඳ මතකයන් සමග දීර්ඝකාලයක් හුදකලාවේ වේදනාවෙන් සිටි අතරුදහන් වූ තැනැත්තන් ගේ පවුල්වල සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන් තේරුම් ගනිමින්ද දශක කිහපයක් පුරා සියලු ජන වර්ගයන්ට අයත් තැනැත්තන් අතුරුදහන්ව ඇති බව පිළිගැනීමට ශ්‍රී ලංකාවේ ජන සමාජයේ අවශ්‍යතාවයක් බව අප හඳුනාගෙන ඇත. ඒ අනුව,

ණ) අතුරුදහන්වූවන් සඳහා සැමරුම් දිනයක් නම් කිරීම.

ත) බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටා තිබූ සමරුම් සිහිවටනය වන අහිංසකාරාමය නැවත ස්ථාපිත කිරීම.

ථ) කැනීම් කටයුතුවලින් අනතුරුව සමූහ මිනීවලවල් සිහිවටන ලෙස ආරක්ෂා කිරීම.

| | |
|---|---|
| ජනාධිපති නීතිඥ සාලිය පීරිස්<br>සභාපති | නීතිඥ එස්.කේ. ලියනගේ<br>කොමසාරිස් |
| ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු<br>කොමසාරිස් | කනපතිපිල්ලෙයි වේන්දන්<br>කොමසාරිස් |
| ජයදීපා පුණ්‍යමූර්ති<br>කොමසාරිස් | මීරාක් රහීම්<br>කොමසාරිස් |
| විශ්‍රාමික මේජර් ජනරාල් මොහන්තී පීරිස්<br>කොමසාරිස් | |

2018 අගෝස්තු 30